කාර්ය සාධන වාර්තාව

செயலாற்று கைஅறிக்கை

Performance Report

2020



රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව

වැවිලි අමාත්‍යාංශය

இறப்பர் அபிவிருத்தித் திணைக்களம்

பெருந்தோட்டக் அமைச்சு

Rubber Development Department

Ministry of Plantation

පෙරවදන

කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ වුව ද රබර් ක්ෂේත්‍රය සංවර්ධනාත්මක පරිවර්තනයකට ලක් වූ මෙන්ම, පැවති අභියෝග හමුවේ ඉලක්ක වෙත ළඟා වීම වෙනුවෙන් උචිත ක්‍රියාමාර්ග ගනිමින් හා යෝග්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කරමින් හඳුනාගත් ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව සාර්ථකව කටයුතු කරන ලද වර්ෂයක් ලෙස 2020 වර්ෂය පෙන්වා දිය හැකිය.

2020 වසරේ කුඩා වතු අංශය විසින් හෙක්ටයාර් 520 ක් වූ ඉලක්කය මත රබර් නැවත වගාව සිදු කරමින් 88% ක භෞතික ප්‍රගතියක් ද හෙක්ටයාර් 820 ක් වූ ඉලක්කයෙන් හෙක්ටයාර් 554.86 ක නැවත වගාව සිදු කරමින් වැවිලි සමාගම් විසින් 68% ක භෞතික ප්‍රගතියක් ද ළඟා කර ගෙන ඇත. රබර් නව වගාව යටතේ කුඩා වතු අංශයේ හෙක්ටයාර් 269 ක් වූ ඉලක්කයෙන් හෙක්ටයාර් 197 ක නව වගාව සිදු කරමින් 73% ක ප්‍රගතියක් අත් කර ගෙන ඇති අතර කුඩා තේ හා රබර් වතු පුනර්ජීවන ව්‍යාපෘතිය යටතේ ද මොනරාගල හා අම්පාර දිස්ත්‍රික්කයන් හි හෙක්ටයාර් 529 ක රබර් නව වගාව සිදු කර ඇත. මේ තුළින් රබර් වගා බිම් ප්‍රමාණය වැඩි වී ඇත. එසේම වැවිලි සමාගම් විසින්ද හෙක්ටයාර 25 ක නව වගාව සිදුකර ඇත.

රජයේ පැල තවාන් මගින් රබර් පැල 1,026,899 ක් නිෂ්පාදනය කරමින් දෙපාර්තමේන්තුව විසින් පිහිටුවා ගත් ඉලක්කයන්ට අනුව 2020 වර්ෂයේ දී රබර් පැළ නිෂ්පාදනය තුළින් 79% ක භෞතික ප්‍රගතියක් අත් කර ගෙන ඇත. පෙර වසරට සාපේක්ෂව 2020 වසරේ දී රබර් නිෂ්පාදනය මෙ.ටො. 78,205 දක්වා වැඩි වී ඇත. 2019 වර්ෂයේ පැවති රබර් ආනයන ප්‍රමාණය වන මෙ.ටො. 50,006 ක ප්‍රමාණය 2020 වර්ෂයේ දී මෙ.ටො. 48,628 ක් දක්වා අඩු වී ඇත. මෙ.ටො. 13,003 ක් වූ 2019 වසරේ ස්වභාවික රබර් අපනයනය සමාලෝචිත වර්ෂය තුළ දී මෙ.ටො. 15,766 ක් දක්වා වැඩි වී ඇත. 2020 වර්ෂයේ දී දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද වැසි ආවරණ යෙදීමේ වැඩසටහන යටතේ වැසි ආවරණ යෙදූ බිම් ප්‍රමාණයේ ශීඝ්‍ර වර්ධනයක් පෙන්නුම් කරනුයේ 2019 වර්ෂයේ හෙක්ටයාර් 2,889.37 ක යෙදූ වැසි ආවරණ ප්‍රමාණය ඉක්මවා හෙක්ටයාර් 6,887.47 ක වැසි ආවරණ යෙදීමෙනි.

2020 වර්ෂයේ දී දේශීය රබර් ඉල්ලුමෙහි ඉහළ යාමත් සමඟ රබර් මිලෙහි සිදු වූ වැඩි වීම රබර් ගොවියාගේ ආදායම කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කරන ලද අතර 2019 වර්ෂයේ නො. 03 රබර් ෂීට් සඳහා පැවති රුපියල් 272.43 ක් වූ මිල, 2020 වර්ෂය තුළ රුපියල් 318.86 දක්වා වැඩි වී ඇත. . එමෙන්ම මෙම වසරේ ප්‍රාග්ධන වියදම් සඳහා වෙන් වූ රු. මී. 1,030.20 ක ප්‍රතිපාදන යටතේ රු. මී. 847.50 ක් වියදම් කිරීම තුළින් 82% ක මූල්‍ය ප්‍රගතියක් ද ළඟා කර ගෙන ඇත.

2020 වර්ෂයේ දී රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව, ඉලක්ක වෙත ළඟා වීම වෙනුවෙන් ක්‍රියාත්මක කරන ලද සියලුම ක්‍රියාකාරකම්හි ප්‍රගතිය හා අත් කර ගත් ප්‍රතිඵල මෙම කාර්ය සාධන වාර්තාව තුළින් ක්ෂේත්‍රයට අදාළව විවිධ වූ පැතිකඩයන් ඔස්සේ වාර්තා කර ඇති අතර, ක්ෂේත්‍රය පිළිබඳව අධ්‍යයනය කිරීමේ දී හා ක්ෂේත්‍රයේ සංවර්ධනය වෙනුවෙන් ප්‍රතිපත්තිමය තීරණ ගැනීමේ දී මෙම වාර්තාව වඩාත් ඉවහල් වනු ඇත.

ස්තුතිය

රබර් වගාවේ උන්නතිය වෙනුවෙන් ක්ෂේත්‍රයේ සංවර්ධන වැඩසටහන් සඳහා **2020** වර්ෂයේ දී රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත රු.මී. **1410** ක ප්‍රතිපාදන වෙන් වූ අතර ඉන් රු.මී. **1202.93** ක් රටේ ආර්ථිකය ශක්තිමත් කිරීමේ පියවරක් වශයෙන් රබර් නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීමටත්, රබර් වගාවේ නියැලෙන ගොවීන්ගේ ජීවන තත්ත්වය නගා සිටුවීමටත්, රට තුළ රබර් වගාව ව්‍යාප්ත කිරීම උදෙසාත් වැය කර ඇත. එම ප්‍රතිපාදන යොදා ගනිමින් දෙපාර්තමේන්තුවට තම ඉලක්ක හා අරමුණු සාක්ෂාත් කර ගනිමින් රටේ ආර්ථික සංවර්ධනයට වැඩි දායකත්වයක් ලබා දීමට **2020** වර්ෂයේ දී ද හැකියාව ලැබී ඇත.

දෙපාර්තමේන්තුවේ අපේක්ෂිත අරමුණු සහ ඉලක්ක සාක්ෂාත් කර ගනිමින් වාර්ෂික සැලසුම් ක්‍රියාවට නැංවීමේ දී අවශ්‍ය මාර්ගෝපදේශනය ලබා දෙමින් සහයෝගය දැක්වූ වැවිලි අමාත්‍යාංශ ගරු අමාත්‍යතුමන්, වැවිලි අමාත්‍යාංශ ලේකම් තුමා ඇතුළු අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයට ද මාගේ විශේෂ ස්තුතිය පුද කරමි.

රබර් අංශයේ ප්‍රවර්ධනය උදෙසා දෙපාර්තමේන්තුව විසින් ගනු ලබන සෑම තීරණයක්ම දීප ව්‍යාප්ත මට්ටමින් ක්‍රියාවට නැංවීම සිදු වන්නේ ප්‍රාදේශීය කාර්යාල ජාලය ඔස්සේ ය. වාර්ෂික කාර්ය සාධන ඉලක්කයන් වෙත ළඟා වීමේ දී ප්‍රාදේශීය කාර්යාලවල අධ්‍යක්ෂවරුන් ඇතුළු කාර්ය මණ්ඩලය විසින් ලබා දෙන නොමද සහයෝගය පැසසිය යුතු ය. එසේම රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව සමඟ සහසම්බන්ධ වෙමින් රටේ ආර්ථික සංවර්ධනයට දායක වන බහුතරයක් වූ කුඩා රබර් වතු හිමියන්ටත්, කුඩා රබර් වතු ක්ෂේත්‍රයේ නියුතු සියලුම දෙනාටත්, මහා පරිමාණ ලෙස වගාවේ සංවර්ධනයට දායකත්වය සපයමින් කටයුතු කරන ප්‍රාදේශීය වැවිලි සමාගම්වල කාර්ය මණ්ඩලයටත් මාගේ ස්තුතිය ප්‍රකාශ කරමි.

ශ්‍රී ලංකාවේ රබර් මිල නිරන්තර උච්ඡාවචනයන්ට භාජනය වීම හේතුවෙන් ගොවීන් අපේක්ෂා කරන මට්ටමට රබර් මිල ළඟා නොවූව ද පෞද්ගලික අංශය විසින් අමු රබර් නිෂ්පාදන මිල දී ගැනීමෙන් දීර්ඝ කාලයක සිට සිදු කරනු ලබන මැදිහත් වීම වඩාත් වැදගත් වේ. එම නිසා රබර් කර්මාන්තයේ උන්නතිය වෙනුවෙන් දායකත්වය සපයනු ලබන පෞද්ගලික අංශයේ කාර්යභාරය ද අගය කළ යුතුම ය. මෙහි දී කුඩා පරිමාණ වෙළඳුන් මෙන්ම රබර් ආශ්‍රිත නිෂ්පාදකයින් ද ඇගයීමට ලක් විය යුතු ය. එසේම දේශීය ආර්ථිකයට අගය එකතු කරමින් විදේශ විනිමය ලබා ගැනීමට දායකත්වය සපයන රබර් ආශ්‍රිත නිෂ්පාදකයින්ටත්, රබර් හා රබර් ආශ්‍රිත අපනයනකරුවන්ටත් මාගේ ස්තුතිය පිරිනමමි.

රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන ඉලක්කයන් ළඟා කර ගැනීමේ දී රබර් වගාව හා සම්බන්ධිත අනෙකුත් ආයතනවලින් ලැබෙනුයේ මහඟු පිටිවහලකි. ඒ අනුව ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය, තුරු සවිය අරමුදල, රබර් මහ ලේකම් කාර්යාලය හා කුඩා තේ හා රබර් වතු පුනර්ජීවන ව්‍යාපෘතිය යන ආයතනවලින් ලැබුණු සහයෝගය මෙහි දී අගය කොට සලකමි. රබර් වගාව තුළින් දේශීය ආර්ථිකය සවිබල ගැන්වීම උදෙසා සිදු කරනු ලබන සියලු කාර්යයන් මනාව සම්බන්ධීකරණය කරමින් අපේක්ෂිත ඉලක්ක වෙත ළඟා වීමේ දී රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ සියලුම කාර්ය මණ්ඩලය විසින් දක්වනු ලැබූ සහයෝගය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

මාධව වර්ණකුලසූරිය
අධ්‍යක්ෂ ජනරාල්
රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව

පටුන

1. ආයතනික පැතිකඩ

1.1.	හැඳින්වීම	**1-2**
1.2.	රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව	**03**
1.3.	ආයතනයේ අරමුණු	**04**
1.4.	ආයතනයේ දැක්ම සහ මෙහෙවර	**04**
1.5.	ආයතනයේ ප්‍රධාන කාර්යයන්	**05**
1.6.	සංවිධාන සටහන	**6-8**

2. දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක වැඩසටහන්හි ප්‍රගතිය

2.1.	රබර් නැවත වගාව	**9-12**
2.2.	රබර් නව වගාව	**12-16**
2.3.	රබර් පැළ නිෂ්පාදනය	**16-19**
2.4.	වැසි ආවරණ යෙදීමේ වැඩසටහන	**20-22**
2.5.	කිරි කැපුම් ශිල්පී පුහුණු වැඩසටහන	**22-25**
2.6.	බද්ධකරුවන් පුහුණු වැඩසටහන	**25-26**
2.7.	වැසි ආවරණ යෙදීමට පුහුණු කිරීමේ වැඩසටහන	**26**
2.8.	අතුරු බෝග වගා වැඩසටහන	**27-28**

2.9. ස්වභාවික රබර් කර්මාන්තය ආශ්‍රිත තොරතුරු - **2020**

2.9.1.	රබර් වගා බිම් ප්‍රමාණය.	**29**
2.9.2.	රබර් නිෂ්පාදනය	**30-31**
2.9.3.	රබර් නිෂ්පාදන වියදම	**31-32**
2.9.4.	දේශීය රබර් පරිභෝජනය -**2020**	**32-33**
2.9.5.	රබර් අපනයනය	**33-34**
2.9.6.	රබර් ආනයනය	**35-36**
2.9.7.	රබර් මිල	**37-40**
2.9.8.	බලපත්‍රලාභී රබර් වෙළඳුන් පිළිබඳ තොරතුරු	**41**
2.9.9.	අන්තර් ජාතික කටයුතු	**41**
2.9.10.	ඒකාබද්ධ අරමුදල	**42-43**
2.9.11.	සෙස් බදු ලැබීම් සහ අය කිරීම්	**43-44**

3. **2020** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වූ වසර සඳහා සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1.	මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය	**45-46**
3.2.	වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය	**46**
3.3.	පරිත්‍යාග සහ වෙනත් ලැබීම් පිළිබඳ කාර්ය සාධනය	**47**
3.4.	මූල්‍ය නොවන වත්කම් වර්තා කිරීමේ කාර්ය සාධනය	**47**
3.5.	විගණකාධිපති වාර්තාව	**48-55**
3.6.	මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය	**56**
3.7.	මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය	**57-58**

4.	කාර්ය සාධන දර්ශක	**59**
5.	තිරසාර සංවර්ධන අරමුණු සපුරාගැනීමේ කාර්ය සාධනය	**60-61**
6.	මානව සම්පත් පැතිකඩ	**62-66**
7.	අනුකූලතා වාර්තාව	**67-72**

1. පරිච්ඡේදය - ආයතනික පැතිකඩ

1.1. හැඳින්වීම

රබර් වගා කරන ලද පළමු ආසියාතික රට වන ශ්‍රී ලංකාවට ස්වාභාවික රබර් කර්මාන්තයෙහිලා හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි.''*Hevea Brasiliensis*''යන උද්භිද විද්‍යාත්මක නාමයෙන් හඳුන්වන රබර් ගසේ නිජ භූමිය වශයෙන් සලකනුයේ දකුණු ඇමරිකාවයි. හෙන්රි වික්හෙම් විසින් බ්‍රසීලියන් රබර් ඇටවලින් හටගත් පැළ කිහිපයක් රැගෙන විත් **1876** වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ ගම්පහ දිස්ත්‍රික්කයේ හෙනරත්ගොඩ උද්‍යානයේ රෝපණය කරමින් ලංකාවේ රබර් වගාවේ මූලාරම්භය සනිටුහන් කරන ලදී. ඉන් පසු ලාංකිකයන් හට ආගන්තුකයෙකු වූ රබර් වගාව දේශීය ආර්ථිකය වෙත ධනාත්මක බලපෑමක් ඇති කරමින් කුඩා සහ මහා පරිමාණ වැවිල්ලක් වශයෙන් ශ්‍රී ලංකාව තුළ ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වෙමින් රබර් වගාවේ ක්‍රමානුකූල සංවර්ධනයක් ඇති වීමට පටන් ගැණුනු අතර දෙවන ලෝක සංග්‍රාමය රබර් වතු හිමියන් හට ස්වර්ණමය යුගයක් උදා කර දෙන ලදී.

ශ්‍රී ලංකාව තුළ රබර් වගාව ආරම්භ කර, ප්‍රථමයෙන්ම තෙත් කලාපය කේන්ද්‍ර කර ගනිමින් මහනුවර, කෑගල්ල, රත්නපුර, මාතලේ, ගම්පහ, කොළඹ, කළුතර, ගාල්ල, මාතර, කුරුණෑගල යන දිස්ත්‍රික්ක තුළ වාණිජමය භෝගයක් වශයෙන් රබර් වගාව ව්‍යාප්ත කරන ලදී. රබර් වගාව දීප ව්‍යාප්ත කිරීමේ අරමුණ ඇතිව සාම්ප්‍රදායික නොවන ප්‍රදේශවල එනම් වර්ෂාපතනය අඩු වියළි හා අතරමැදි කලාපය තුළ රබර් වගාව ව්‍යාප්ත කිරීම සම්බන්ධව රබර් පර්යේෂණ ආයතනයේ සහ රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අවධානය යොමු වීමෙන් අනතුරුව මොනරාගල, හම්බන්තොට, අම්පාර, වවුනියාව, අනුරාධපුර සහ පොළොන්නරුව යන දිස්ත්‍රික්ක තුළ ද රබර් වගාව ව්‍යාප්ත කිරීමට හැකියාව ලැබී ඇත.

ශ්‍රී ලංකාවේ රබර් මිල සහ නිෂ්පාදනය පිළිබඳව සලකා බැලීමේ දී වාර්තාගත ඉහළම රබර් මිලක් සහ රබර් නිෂ්පාදනයක් **2011** වර්ෂයේ දී වාර්තා වූ අතර එම වසරේ දී රබර් කිලෝ ග්‍රෑම් **1** ක් සඳහා **(**ෂීට් රබර් නො. **01)** රුපියල් **513** ක මිලක් ද සමස්ථ රබර් නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් මිලියන **158** ක අගයක පැවතිණි. එසේ වුවද රබර් මිලෙහි සිදු වන නිරන්තර උච්චාවචන ඇතැම් කාල වකවානුවල වගාකරුවන්ට ඔරොත්තු නොදෙන තත්ත්වයක් බවට ද පත්වී ඇත. නිෂ්පාදන වියදම ඉහළ යෑමට සමගාමීව රබර් මිල ඉහළ යාමක් දක්නට නොලැබෙන බැවින් ඇතැම් අවස්ථාවල නිෂ්පාදන වියදම, රබර් මිල අභිභවා යාමක් ද දැක ගත හැකි වේ. එසේ වුව ද **2019** වසරට සාපේක්ෂව **2020** වර්ෂයේ රබර් මිලෙහි සැලකිය යුතු ඉහළ යාමක් සිදු වූ අතර එය **(**ෂීට් රබර් නො. **01)** රබර් කිලෝ ග්‍රෑම් **1** ක් සඳහා රුපියල් **288.48** සිට රුපියල් **350.04** ක් දක්වා ඉහළ යාමකි.

රබර් කර්මාන්තය, ගෝලීය සබඳතා සහිත සම්පත් පදනම් වූ, නවීන තාක්ෂණය හා මුසු වූ කර්මාන්තයක් ලෙස ශ්‍රී ලංකා ආර්ථිකයෙහි වැදගත් භූමිකාවක් ඉටු කරයි. මෙම කර්මාන්තය ස්වාභාවික රබර් නිෂ්පාදනයේ සිට අගය එකතු කළ රබර් ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදනය දක්වා සීඝ්‍ර පරිවර්තනයකට ලක්ව ඇත. මෙරට රබර් නිෂ්පාදන සඳහා අන්තර්ජාතික වශයෙන් ඉතා ඉහළ ඉල්ලුමක් පවතිනුයේ එම රබර්වල උසස් තත්ත්වය හා කල්පැවැත්ම හේතුවෙනි. **2020** වසරේ දී පකිස්ථානය, මැලේසියාව, ජපානය, ජර්මනිය, චීනය, ඉතාලිය සහ ඉන්දියාව යන රටවල් ශ්‍රී ලංකාවේ ප්‍රධාන රබර් ගැනුම්කරුවෝ වූ අතර එම වසරේ රබර් අපනයනයෙන් ලද ආදායම රු. මි. **151,080** කි.

රබර් අපනයනය හරහා විදේශ විනිමය ඉපයීම මෙන්ම ඒ වටා බැඳුණු ආර්ථිකමය ප්‍රතිලාභ රැසකි. රබර් කර්මාන්තය සමග විශාල රැකියා අවස්ථාවන් වතුකරයේ ජනතාවට සහ ග්‍රාමීය ජනතාවට හිමි වීම ඒ අතර වැදගත් සාධකයකි. මෙම රැකී රක්ෂා, කිරි කැපීමේ සිට අපනයනය දක්වා වූ ක්‍රියාවලිය තුළින් බිහි වී ඇති අතර රටේ ආර්ථික වර්ධනයට හා ආදායම් විෂමතාවය අවම කිරීමට ද ඉවහල් වේ. එපමණක් නොව පාරිසරික වශයෙන් ස්වභාව සෞන්දර්ය සහ වනාන්තර වෙත මහත් තර්ජනයක් එල්ල වී ඇති වර්තමානයේ පාරිසරික සමතුලිතතාවය ආරක්ෂා කිරීමට ද රබර් වගාව තුළින් ලැබෙනුයේ මහගු දායකත්වයකි. තව ද රබර් ශාකය දැව වශයෙන් සහ ඉන්ධන වශයෙන් ද

භාවිතයට ගනු ලබයි. රබර් ඇට උපයෝගී කරගනිමින් තෙල් නිපදවන අතර සත්ත්ව ආහාර නිෂ්පාදනය සඳහා ද යොදා ගනී.

මෙසේ වුව ද වර්තමානය වන විට රබර් වගාවට අත් වී ඇති ඉරණම ඛේදණීය තත්ත්වයකි. කාලයත් සමග ගොවීන් රබර් වගාව තුළින් දුරස් වීමක් දක්නට ලැබෙන අතර රබර් වගා භූමි ප්‍රමාණය ද ක්‍රමයෙන් අඩු වෙමින් පවතී. **2020** වර්ෂයේ දී ශ්‍රී ලංකාව ගෝලීය රබර් නිෂ්පාදනයෙන් **0.59%** ක් පමණක් සපයමින් **14** වන ස්ථානය දක්වා පහත වැටී ඇත. **(ANRPC** දත්ත අනුව) මෙම තත්ත්වය සඳහා ප්‍රධාන වශයෙන් නිෂ්පාදන පිරිවැය ඉහළ යාම, රබර් සඳහා සාධාරණ මිලක් නොලැබීම හා මිල නිරන්තර උච්චාවචනයන්ට ලක් වීම, කම්කරු හිඟය, කුඩා වතු හිමියන් බහුතරයක් රබර් වගාවෙන් ඉවත් වීම සහ රබර් වගාවට වැළඳෙන රෝග ප්‍රමාණය ඉහළ යාම වැනි සාධක දේශීය වශයෙනුත් **19** වන ශත වර්ෂයේ මුල් භාගයේ දී රබර් වගාවේ නියුතු නොවූ රටවල් මේ වන විට රබර් වගා ක්ෂේත්‍රයේ ඉදිරියට පැමිණීම ජාත්‍යන්තර වශයෙනුත් හේතු වී ඇත.

ශ්‍රී ලංකාව International Rubber Study Group (IRSG) ´ජාත්‍යන්තර රබර් අධ්‍යයන කණ්ඩායම´ හා Association of Natural Rubber Producing Countries (ANRPC)´ ස්වාභාවික රබර් නිපදවන රටවල සංගමය´ ආදී අන්තර්ජාතික සංවිධානවල සාමාජිකත්වය දරමින් සාමාජික රටවල නිෂ්පාදන දත්ත, අලෙවිකරණ තොරතුරු හා රබර් කර්මාන්තයේ විවිධ පැති ඔස්සේ අත්දැකීම් බෙදාගනිමින් රබර් නිෂ්පාදනය සම්බන්ධ අන්තර්ජාතික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරමින් දේශීය රබර් කර්මාන්තයේ උන්නතිය වෙනුවෙන් සක්‍රීය දායකත්වයක් ලබා දෙයි.

1.2. රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන භෝග ත්‍රිත්වය අතරින් රබර් කර්මාන්තයට විශේෂ වැදගත්කමක් හිමි වේ. අපනයන භෝගයක් ලෙස රට තුළට ගලා එන විදේශ විනිමය මෙන්ම ඒ ආශ්‍රිත දේශීය කර්මාන්ත හරහා දේශීය ගොවියාට ලැබෙන ප්‍රතිලාභ බහුලය. මේ සඳහා රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව සතු කාර්යභාරය සුවිශේෂී වේ. වර්ෂ 1956 අංක 11 දරණ රබර් පාලන පනතේ සහ වර්ෂ 1953 අංක 36 දරණ රබර් නැවත වගා සහනාධාර පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා වැවිලි අමාත්‍යාංශය යටතේ රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක වේ. වර්ෂ 1934 දී අංක 6 දරණ ආඥා පනත මගින් රබර් පාලන දෙපාර්තමේන්තුව නමින් ආරම්භ කරන ලද මෙම දෙපාර්තමේන්තුව වර්ෂ 1994 දී අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව වඩාත් ශක්තිමත් කර රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවන ලදී. දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති සේවා දිවයිනම ආවරණය වන පරිදි පිහිටුවා ඇති උප කාර්යාල 05 ක් මඟින් සිදුකරනු ලබන අතර මෙම ප්‍රාදේශීය කාර්යාල මඟින් රබර් වගා කරනු ලබන සියලුම දිස්ත්‍රික්ක ආවරණය කිරීමට කටයුතු සලසා ඇත.

ප්‍රාදේශීය කාර්යාලය	ආවරණය කරන දිස්ත්‍රික්කය
කෑගල්ල	කෑගල්ල, ගම්පහ, කුරුණෑගල, මහනුවර, මාතලේ, නුවරඑළිය, අනුරාධපුර, පොළොන්නරුව, පුත්තලම හා වවුනියාව
කළුතර	කළුතර
රත්නපුර	රත්නපුර හා කොළඹ
ගාල්ල	ගාල්ල, මාතර හා හම්බන්තොට
මොනරාගල	මොනරාගල, අම්පාර හා බදුල්ල

වගු අංක I

ඉහත කාර්යාලවලට අමතරව දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී රබර් වගාව සිදු කිරීමේ දී රබර් වගාකරුවන්ට ප්‍රමිතියෙන් ඉහළ උසස් ක්ලෝනවලින් නිමැවුණු රබර් පැළ ලබා දීමට හැකි වන පරිදි දිවයින පුරා විසිරුණු තවාන් පද්ධතියක් පහත පරිදි ස්ථාපිතව ඇත. කුඩා වතු හිමියන්ගේ පැළ අවශ්‍යතාවය සම්පූර්ණ කිරීමට දෙපාර්තමේන්තුවට හැකියාව ලැබී ඇති අතර අවස්ථාවෝචිතව පුද්ගලික වැවිලි සමාගම් වෙතද පැළ ලබාදීමක් සිදු කර ඇත.

තවානේ නම	දිස්ත්‍රික්කය
වැලිකඩමුල්ල	ගම්පහ
මීරිගම	ගම්පහ
ඇඟල්ඔය	කළුතර
ගුරුගොඩ	කළුතර
කරපිංච	රත්නපුර
මිද්දෙණිය	හම්බන්තොට
කුඹුක්කන	මොනරාගල
පදියතලාව	අම්පාර

වගු අංක II

1.3. ආයතනයේ අරමුණු

- පවතින රබර් වගා ඉඩම්හි ඵලදායීතාවය ඉහළ නැංවීම හා රබර් වගා බිම් ප්‍රමාණය වැඩි කිරීම තුළින් දේශීය රබර් නිෂ්පාදනය ඉහළ නැංවීම.
- රබර් හා රබර් ආශ්‍රිත නිෂ්පාදනයන්හි ගුණාත්මකභාවය වැඩි කිරීම තුළින් රබර් සඳහා වැඩි මිලක් ලබා ගැනීම හා ගොවීන්ගේ ආදායම ඉහළ නැංවීම.
- ක්ෂේත්‍රයේ රැකියා උත්පාදනය ඉහළ නැංවීම තුළින් සමාජ සුරක්ෂිතතාවය ඇති කිරීම.
- දේශීය දැව අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම සඳහා දායක වීම.
- ස්වභාවික පරිසරයේ සමතුලිතතාවය ආරක්ෂා කිරීම සඳහා වගාවේ තිරසාරභාවය තහවුරු කිරීම.

1.4. ආයතනයේ දැක්ම සහ මෙහෙවර

දැක්ම

ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනය සඳහා වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රයේ ප්‍රමුඛතම කොටස්කරු වීම.

මෙහෙවර

නෛතිකව දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති බලතල හා කාර්යයන්ට අනුගතව ශ්‍රී ලංකාවේ රබර් වගාව හා රබර් වගාව ආශ්‍රිත කර්මාන්තයන්හි ගුණාත්මක හා ප්‍රමාණාත්මක වර්ධනය උදෙසා කෘෂි ව්‍යාප්ති සේවා ක්‍රියාත්මක කිරීම

1.5. ආයතනයේ ප්‍රධාන කාර්යයන්

1.5.1. ප්‍රධාන කාර්යාලයේ ප්‍රධාන කාර්යයන්

- ප්‍රධාන පනත් හා නෛතික මූලාශ්‍ර මගින් පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීම.
- ප්‍රාදේශීය කාර්යාල වල කටයුතු අධීක්ෂණය කිරීම
- නැවත වගා සහ අළුත් වගා සහනාධාර ක්‍රම පරිපාලනය කිරීම හා ප්‍රාදේශීය කාර්යාල මගින් සහනාධාර ලබාදීම අධීක්ෂණය කිරීම
- රජයේ තවාන් හා පෞද්ගලික රබර් පැළ තවාන් මගින් උසස් වර්ගයේ රබර් පැළ නිෂ්පාදනය කිරීම හා පුද්ගලික අංශයේ පැළ නිෂ්පාදනයට උපදෙස් සැපයීම.
- රබර් වෙළඳාම, රබර් ආශ්‍රිත නිෂ්පාදනය හා රබර් අපනයනය සඳහා බලපත්‍ර ලබා දීම.
- රබර් වගා බිම් ප්‍රමාණය, නිෂ්පාදනය, දේශීය පරිභෝජනය හා අපනයනය යනාදී වැදගත් දත්ත හා තොරතුරු එක් රැස් කිරීම.
- වෙළඳපල පිළිබඳව කුඩා රබර් හිමියන් දැනුවත් කිරීම.
- ස්වභාවික රබර් නිෂ්පාදනය, පරිභෝජනය හා වෙළඳාම සම්බන්ධව අන්තර්ජාතික සංවිධාන සමඟ කටයුතු කිරීම.
- සෙස් අරමුදල් එකතු කිරීම හා පරිපාලනය.
- රබර් වගාවේ හා නිෂ්පාදනයේ ඒ ඒ අවධිවලට අදාලව කුඩා ඉඩම් හිමියන් වෙත අවශ්‍ය දැනුම හා උපදෙස් ලබා දීම.
- කුඩා ඉඩම් හිමියාගේ ආර්ථික උන්නතිය උදෙසා කටයුතු සංවිධානය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- රබර් අංශයේ ඵලදායිතාවය හා නිෂ්පාදනය ඉහළ නැංවීම අරමුණු කරගත් රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම හා ඒ සඳහා ප්‍රමුඛ ආයතනය ලෙස කටයුතු කිරීම.
- රාජ්‍ය ආදායම ඇස්තමේන්තු කිරීම, එක්රැස් කිරීම හා ගිණුම්කරණ කටයුතු කිරීම.

1.5.2. ප්‍රාදේශීය කාර්යාල මඟින් ඉටු කරන ප්‍රධාන කාර්යයන්

- රබර් වගාව සඳහා ඉඩම් ලියාපදිංචි කිරීම.
- රබර් නැවත වගාව හා නව වගාව සිදුකිරීම.
- වගාකරුවන් සඳහා වගා සහනාධාර ඇතුළු අනෙකුත් සහනාධාර ලබාදීම.
- රබර් වෙළඳභිමියන් සඳහා වෙළඳ බලපත්‍ර ලබා දීම.
- රජයේ රබර් පැළ තවාන් පවත්වාගෙන යාම හා පුද්ගලික පැළ තවාන් අධීක්ෂණය.
- ගොවීන් හා වතු හිමියන් සඳහා අවශ්‍ය තාක්ෂණික උපදෙස් ලබා දීම.
- රබර් පැළ බෙදා හැරීම.
- රබර් වගාවට වැළඳෙන රෝග සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය දැනුවත් කර මර්ධනය සඳහා අවශ්‍ය පියවර ගැනීම.
- රබර් වගා හිමියන්ගේ ආර්ථික ශක්තිය නගා සිටුවීම සඳහා ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

1.5.3. රබර් පැල තවාන්වල ප්‍රධාන කාර්යයන්

ජාතික ඉලක්කයන් අරහයා,

- නැවත වගාව හා නව වගාව සඳහා අවශ්‍ය ප්‍රමිතියෙන් උසස් බද්ධ රබර් පැළ රබර් පර්යේෂණායතනයේ නිර්දේශ මත නිෂ්පාදනය කර බෙදා හැරීම.
- ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනයේ නව ක්ලෝන සොයා ගැනීම් වලට අනුව වැඩි දියුණු කරන ලද ප්‍රභේද ගොවීන්ට හඳුන්වා දීම.
- අවශ්‍ය අවස්ථාවලදී වැවිලි සමාගම් වල පැල අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම.

1.6 සංවිධාන සටහන

1.6.1. රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය



1.6.2. රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ආයතන ව්‍යුහය



1.6.3. දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල තොරතුරු

අනු අංකය	තනතුර	අනුමත ප්‍රමාණය	දැනට සිටින ප්‍රමාණය	පුරප්පාඩු ප්‍රමාණය
01	අධ්‍යක්ෂ ජනරාල් (ශ්‍රී ලං.ප.සේ)	1	1	0
02	අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (ශ්‍රී ලං.ප.සේ)	1	1	0
03	අධ්‍යක්ෂ/ ප්‍රාදේශීය අධ්‍යක්ෂ (ශ්‍රී ලං.ප.සේ)	7	2	5
04	අධ්‍යක්ෂ (ශ්‍රී ලං.ක්‍ර.සේ)	1	1	0
05	අධ්‍යක්ෂ (දෙපාර්තමේන්තුගත)	1	0	1
06	ප්‍රධාන ගණකාධිකාරි (ශ්‍රී ලං.ග.සේ)	1	1	0
07	ප්‍රධාන අභ්‍යන්තර විගණක (ශ්‍රී ලං. ග. සේ.)	1	1	0
08	නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (ශ්‍රී ලං.ප.සේ)	12	9	3
09	නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (දෙපාර්තමේන්තුගත)	1	0	1
10	නීති නිලධාරි (දෙපාර්තමේන්තුගත)	1	0	1
11	නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (ශ්‍රී ලං.ක්‍ර.සේ)	1	1	0
12	ගණකාධිකාරි (ශ්‍රී ලං.ග.සේ)	6	4	2
13	නියෝජ්‍ය අධ්‍යක්ෂ (ශ්‍රී ලං.තො හා සන්.තා.සේ)	1	1	0
14	සහකාර අධ්‍යක්ෂ (ශ්‍රී ලං.තො හා සන්.තා.සේ)	2	1	1
15	පරිපාලන නිලධාරි (රා.ක.ස.සේ.- විශේෂ)	4	3	1
16	ජ්‍යෙෂ්ඨ රබර් සංවර්ධන නිලධාරි - ව්‍යාප්ති (දෙපාර්තමේන්තුගත)	17	7	10
17	භාෂා පරිවර්තක - සිංහල/දෙමළ (භා. ප. සේ)	1	0	1
18	තොරතුරු තාක්ෂණ නිලධාරි (ශ්‍රී ලං.තො හා සන්.තා.සේ)	2	0	2
19	තොරතුරු තාක්ෂණ සහකාර (ශ්‍රී ලං.තො හා සන්.තා.සේ)	5	3	2
20	සංවර්ධන නිලධාරි (සං. නි. සේ)	22	23	0
21	ලිපිකරු/යතුරු ලේඛක (දෙපාර්තුමේන්තුගත)	8	6	2
22	තවාන් කළමණාකරු (දෙපාර්තුමේන්තුගත)	2	2	0
23	ගොඩනැගිලි නඩත්තු නිළධාරි (දෙපාර්තුමේන්තුගත)	1	1	0
24	රාජ්‍ය කළමණාකාර සහකාර (රා.ක.ස.)	120	115	5
25	කළමණාකාර සහකාර (ක.ස.)	5	8	0
26	රබර් සංවර්ධන නිලධාරි (දෙපාර්තුමේන්තුගත)	170	120	50
27	රියදුරු (රි.සේ.)	40	24	16
28	රියදුරු (දෙපාර්තුමේන්තුගත)	1	1	0
29	ලොරි සහයක (දෙපාර්තුමේන්තුගත)	10	10	0
30	කාර්යාල කාර්ය සහයක (කා.කා.ස.)	33	31	2
	එකතුව	478	377	105

වගු අංක III

2. පරිච්ඡේදය - දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක වැඩසටහන්හි ප්‍රගතිය

පෙර වර්ෂ තුළ සිදු කරනු ලැබූ ක්‍රියාකාරකම් සහ වැඩසටහන් තුළින් උකහා ගත් අත්දැකීම් මත පදනම් වෙමින් 2020 වර්ෂයේ දී රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ඉලක්කගත අරමුණු සාක්ෂාත් කර ගනු වස් පහත සඳහන් කාර්යයන් මූලික වශයෙන් ඉටු කර ඇත.

1. රබර් නැවත වගා කිරීමේ වැඩසටහන - (කුඩා වතු / වැවිලි සමාගම්)
2. රබර් නව වගා කිරීමේ වැඩසටහන (කුඩා වතු)
3. ගුණාත්මක බද්ධ රබර් පැළ නිෂ්පාදනය
4. වැසි ආවරණ යෙදීමේ වැඩසටහන - (කුඩා වතු / වැවිලි සමාගම්)
5. කිරි කැපුම් ශිල්පී පුහුණුව - (සාමාන්‍ය / වෘත්තීය)
6. වැසි ආවරණ යෙදීමේ පුහුණු වැඩසටහන
7. බද්ධකරුවන් පුහුණුව
8. අතුරු භෝග වගා වැඩසටහන

2.1. රබර් නැවත වගාව

රබර් වගා ඉඩම්හි පවතින පැරණි රබර් වගාව ඉවත් කර නව රබර් පැල වගා කිරීම රබර් නැවත වගාව වශයෙන් හඳුන්වනු ලබයි. රබර් නැවත වගා කිරීමේ අවශ්‍යතාවය පැන නගිනුයේ රබර් ඉඩම්හි පවතින රබර් ශාක වයස්ගත වීම, වගා කර ඇති ශාකවල ඵලදායීතාවය පහළ යාම වැනි කරුණු හේතුවෙනි. රබර් නැවත වගාව සඳහා ගොවීන් නැඹුරු කරලීම උදෙසා සානුබලයක් වශයෙන් රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් කුඩා වතු හිමියන් සහ ප්‍රාදේශීය වැවිලි සමාගම් වෙත නැවත වගා සහනාධාර ලබා දීමට කටයුතු කරනු ලැබේ. දෙපාර්තමේන්තුව මගින් නැවත වගා කරනු ලබන ඉඩම් හෙක්ටයාර් එකක් සඳහා රු. 350,000 ක් බැගින් වගා සහනාධාර ලබා දේ.



නැවත වගා කළ යුතු රබර් වගාවක්

2020 වර්ෂයේ දී දෙපාර්තමේන්තුව වෙත කුඩා වතු අංශය මගින් නැවත වගාව සඳහා 1,069 ක අයදුම්පත්‍ර ප්‍රමාණයක් ඉදිරිපත් වූ අතර ඉන් බලපත්‍ර නිකුත් කරනු ලැබුයේ අයදුම්පත්‍ර 966 ක් සඳහා පමණි. එම බලපත්‍ර යටතේ බලපත්‍රලාභීන් 640 දෙනෙකු විසින් හෙක්ටයාර් 457 ක භූමි ප්‍රමාණයක රබර් නැවත වගාව සිදු කර ඇත. කුඩා වතු අංශයේ හෙක්. 520 ක් වූ ඉලක්කය අනුව රබර් නැවත වගාවේ 88% ක භෞතික ප්‍රගතියක් දෙපාර්තමේන්තුව අත් කර ගෙන ඇති අතර ඊට අදාළ තොරතුරු පහත වගුව තුළින් දක්වා ඇත.

කුඩා වතු අංශය විසින් රබර් නැවත වගා සහනාධාර ක්‍රමය යටතේ නැවත වගා කළ බිම් ප්‍රමාණය -2020

දිස්ත්‍රික්කය	ඉලක්කය (හෙක්.)	ලැබුණු අයදුම් පත්‍ර සංඛ්‍යාව	අයදුම් පත්‍රවලට අදාළ බිම් ප්‍රමාණය (හෙක්.)	නිකුත් කළ බලපත්‍ර සංඛ්‍යාව	බලපත්‍ර නිකුත් කළ බිම් ප්‍රමාණය (හෙක්.)	නැවත වගාව සිදු කළ බලපත්‍රලාභීන් සංඛ්‍යාව	නැවත වගා කළ බිම් ප්‍රමාණය (හෙක්.)
කළුතර	100	193	168	166	149	116	92
කෑගල්ල	200	501	352	457	317	307	192
ගම්පහ	40	46	29	42	28	31	21
කුරුණෑගල	15	31	30	27	26	19	23
මහනුවර	10	42	28	24	19	10	7
මාතලේ	5	03	19	03	14	-	-
රත්නපුර	70	158	135	152	123	94	66
කොළඹ	30	56	66	56	64	39	39
ගාල්ල	10	11	06	11	6	04	3
මාතර	25	17	18	17	18	09	7
මොනරාගල	07	11	8	11	7	11	7
බදුල්ල	08	-	-	-	-	-	-
එකතුව	520	1069	859	966	771	640	457

වගු අංක IV

මේ අනුව 2020 වර්ෂයේ දී දෙපාර්තමේන්තුව විසින් ඉලක්කගත බිම් ප්‍රමාණය අභිභවා ගොවීන් වෙත බලපත්‍ර නිකුත් කළ ද එයට සාපේක්ෂව එම බලපත්‍ර හිමියන් විසින් වගා කටයුතු සිදු කර නොමැති බව නිරූපණය වේ. දිස්ත්‍රික්ක වශයෙන් කුඩා වතු අංශය විසින් රබර් නැවත වගාව සිදු කළ ආකාරය පහත පරිදි වේ.

ප්‍රස්තාර අංක i

කුඩා වතු අංශය විසින් රබර් නැවත වගා කළ බිම් ප්‍රමාණය (හෙක්ටයාර්) - 2020



ඉහත ප්‍රස්ථාරයට අනුව 2020 වර්ෂයේ දී අනෙකුත් දිස්ත්‍රික්ක අභිභවමින් කෑගල්ල, කළුතර සහ රත්නපුර දිස්ත්‍රික්කවල වැඩි වශයෙන් රබර් නැවත වගාව සිදු කර ඇති බව තහවුරු වේ. මෙම වසරේ දී රබර් නැවත වගාව සඳහා දෙපාර්තමේන්තුව විසින් රු.මි. 259.39 ක වැයක් දරා ඇත.
කුඩා වතු අංශය මෙන්ම ප්‍රාදේශීය වැවිලි සමාගම් ද රබර් නැවත වගාවෙහි දී උපරිම දායකත්වයක් ලබාදී ඇත. වැවිලි සමාගම් විසින් 2020 වසරේ දී සිදු කරනු ලැබූ රබර් නැවත වගාව පිළිබඳ තොරතුරු පහත වගුව තුළින් පෙන්වා දී ඇත.

රබර් නැවත වගාව වැවිලි සමාගම් - 2020

වතු සමාගම	බලපත්‍ර නිකුත් කළ බිම් ප්‍රමාණය (හෙක්ටයාර්)	නැවත වගා කළ බිම් ප්‍රමාණය (හෙක්ටයාර්)
නමුණුකුල වැවිලි සමාගම	7.00	7.00
කෑගල්ල වැවිලි සමාගම	467.00	76.32
කැළණිවැලි වැවිලි සමාගම	11.23	11.23
මල්වත්තවැලි වැවිලි සමාගම	68.5	43.88
ලලාන් වැවිලි සමාගම	166.22	158.57
පුස්සැල්ලාව වැවිලි සමාගම	76.74	96.90
අගලවත්ත වැවිලි සමාගම	173.58	125.46
ජනතා වතු සංවර්ධන මණ්ඩලය	35.50	35.50
එකතුව	970.27	554.86

වගු අංක V

2020 වසරේ දී වැවිලි සමාගම් සඳහා හඳුනාගත් හෙක්. 820 ක ඉලක්කයක් හමුවේ හෙක්. 554.86 ක් වගා කර වැවිලි සමාගම් රබර් නැවත වගාව තුළින් 68% ක භෞතික ප්‍රගතියක් අත් කර ගැනීමට සමත්ව ඇත. දෙපාර්තමේන්තුව විසින් වැවිලි සමාගම් වෙත රබර් නැවත වගාව සඳහා රු. මි 203.01 ක මුදලක් වෙන් කර ඇති අතර ඉන් රු.මි 181.36 ක් වැය කරමින් 89% ක මූල්‍ය ප්‍රගතියක් හිමි කර ගෙන ඇත. 2020 වසරේ දී වැවිලි සමාගම් අංශයේ රබර් නැවත වගා කළ භූමි ප්‍රමාණයට 28.5% ක දායකත්වයක් සපයමින් අනෙකුත් වැවිලි සමාගම් අභිභවා ලලාන් වැවිලි සමාගම පෙරමුණට පැමිණීම කැපී පෙනේ.

රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2020 වර්ෂයේ දී සමස්ථ නැවත වගා ඉලක්කය හෙක්. 1,340 ක් වුවද නැවත වගාව සිදු කර ඇත්තේ හෙක්. 1012 ක භූමි ප්‍රමාණයක පමණි. ඒ අනුව රබර් නැවත වගාවේ සමස්ථ භෞතික ප්‍රගතිය 76% ක් වේ.

රබර් නැවත වගා බිම් ප්‍රමාණය (2012 – 2020)
(හෙක්ටයාර්)

වර්ෂය	කුඩා වතු	වැවිලි සමාගම්	එකතුව
2012	1,117	2,126	3,243
2013	1,710	2,784	4,494
2014	1,343	1,554	2,897
2015	614	1,303	1,917
2016	538	1,048	1,586
2017	787	400	1,187
2018	525	336	861
2019	578	462	1,040
2020	457	**555**	**1,012**

වගු අංක **VI**

2.2. රබර් නව වගාව

පවතින රබර් වගා ඉඩම්හි ඵලදායීතාවය ඉහළ නැංවීම සහ රබර් වගා බිම් ප්‍රමාණය ඉහළ නැංවීම තුළින් රබර් නිෂ්පාදනය වර්ධනය කිරීම හරහා ආර්ථික සංවර්ධනයට දායක වීම දෙපාර්තමේන්තුවේ මූලික පරමාර්ථය වී ඇත. වක්‍රාකාරව ක්ෂේත්‍රය තුළ නව රැකියා උත්පාදනය කිරීම තුළින් ආදායම් ඉහළ නැංවීම, වගා නොකරන ඉඩම් වගා කටයුතු සඳහා යොදා ගැනීම සහ ස්වාභාවික පරිසරයේ සමතුලිතතාවය ආරක්ෂා කිරීම සඳහා වගාවේ තිරසාරභාවය ආරක්ෂා කිරීම නව වගාවේ සෙසු අරමුණු වේ. රබර් නව වගාව සිදු කිරීමේ දී කුඩා වතු අංශය සඳහා පමණක් වගා සහනාධාර ලබා දීම රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබේ. පහත වගුව තුළින් **2020** වර්ෂයට අදාළව රබර් නව වගාව සම්බන්ධ තොරතුරු ඉදිරිපත් කර ඇත.

දෙපාර්තමේන්තුවේ සහනාධාර යටතේ රබර් නව වගා කළ බිම් ප්‍රමාණය - 2020 (කුඩා වතු)

දිස්ත්‍රික්කය	ඉලක්කය	ලැබුණු අයදුම් පත්‍ර සංඛ්‍යාව	අයදුම් පත්‍ර වලට අදාළ බිම් ප්‍රමාණය (හෙක්ටයාර්)	නිකුත් කළ බලපත්‍ර සංඛ්‍යාව	බලපත්‍ර නිකුත් කළ බිම් ප්‍රමාණය (හෙක්ටයාර්)	නව වගාව අවසන් කළ බලපත්‍ර ලාභීන් සංඛ්‍යාව	නව වගාව සිදු කළ බිම් ප්‍රමාණය (හෙක්ටයාර්)
කළුතර	15	58	25.58	50	18.78	33	14.27
කෑගල්ල	25	135	54.01	114	45.97	82	32.25
ගම්පහ	01	20	13.23	16	11.46	10	7.05
කුරුණෑගල	12	16	17.16	14	8.96	08	5.08
පුත්තලම	-	01	8.09	01	8.09	-	-
මහනුවර	01	19	9.50	14	7.33	08	4.20
මාතලේ	51	31	12.34	29	11.54	20	5.50
රත්නපුර	20	78	44.23	69	41.06	57	30.43
කොළඹ	10	16	14.14	13	12.73	07	5.77
ගාල්ල	05	10	5.70	10	5.70	07	2.13
මාතර	05	14	9.14	14	9.14	10	2.97
හම්බන්තොට	10	19	8.07	19	8.07	11	5.02
මොනරාගල	70	124	77.76	115	68.93	106	63.99
බදුල්ල	20	31	15.22	31	15.22	28	12.33
අම්පාර	10	02	0.85	-	-	-	-
රජයේ පැල තවාන්	05	-	-	-	-	-	06
එකතුව	260	574	315.02	509	272.98	387	196.99

වගු අංක VII

ඉහත තොරතුරුවලට අනුව 2020 වසරේ දී රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව හෙක්. 260 ක රබර් නව වගාව සිදු කිරීමට ඉලක්ක පමුණුවා ගත් අතර කුඩා වතු අංශය විසින් හෙක්. 196.99 ක ද වැවිලි සමාගම් විසින් හෙක්. 25.39 ක ද රබර් නව වගාව සිදු කර ඇත. ඊට අමතරව රජයේ තවාන් මගින් සිදු කරන ලද හෙක්. 6 ක ආදර්ශ රබර් නව වගා වැඩසටහන් ද ඇතුළත්ව යෝජිත වසරේ සමස්ථ රබර් නව වගා භූමි ප්‍රමාණය හෙක්. 222.38 ක් වේ. ඒ අනුව 2020 වසරේ දී රබර් නව වගාව තුළින් 86% ක භෞතික ප්‍රගතියක් වෙත ළඟා වීමට හැකි වූ අතර ඒ සඳහා දෙපාර්තමේන්තුව විසින් රු.මි. 117.69 ක වැයක් දරා ඇත. මෙම වසරේ දී කුඩා වතු අංශය විසින් දිස්ත්‍රික්ක 15 ක රබර් නව වගාව සිදු කරන ලද අතර එහි ව්‍යාප්තිය පහත ප්‍රස්තාරය මගින් නිරූපණය කර ඇත.



2020 රබර් නව වගා කළ බිම් ප්‍රමාණය (හෙක්ටයාර්) - කුඩා වතු

ඉහත ප්‍රස්තාරයට අනුව **2020** වසරේ දී මොනරාගල, කෑගල්ල සහ රත්නපුර යන දිස්ත්‍රික්ක තුළ රබර් නව වගාව වැඩි වශයෙන් සිදු කර ඇති අතර අනෙකුත් දිස්ත්‍රික්ක අභිභවමින් මොනරාගල දිස්ත්‍රික්කය රබර් නව වගාව තුළ ප්‍රමුඛස්ථානයක් හිමි කර ගෙන ඇති බව සනාථ වේ. මේ තුළින් මොනරාගල දිස්ත්‍රික්කයේ ගොවීන් කෘෂිකාර්මික වැවිලි භෝගයක් ලෙස රබර් වගාව තෝරා ගැනීමේ ඉහළ ප්‍රවණතාවක් පවතින බව දෘෂ්‍යමාන වේ. එමෙන්ම කෑගල්ල, ගම්පහ සහ රත්නපුර දිස්ත්‍රික්ක තම ඉලක්කය ඉක්මවමින් රබර් නව වගාව සිදු කර ඇත. **2015** වර්ෂයේ සිට මේ දක්වා වාර්ෂික නව වගා බිම් ප්‍රමාණයට ඉහළ දායකත්වයක් සැපයූ දිස්ත්‍රික්ක පහත පරිදි වේ.

වර්ෂය	දිස්ත්‍රික්කය	වගා කළ බිම් ප්‍රමාණය (හෙක්.)
2015	අම්පාර	**400**
2016	අම්පාර	**213**
2017	මොනරාගල	**102**
2018	මොනරාගල	**158**
2019	මොනරාගල	**89**
2020	මොනරාගල	**64**

වගු අංක **VIII**

තව ද ඉහත තොරතුරු අනුව අතීතයේ සිට රබර් වගාවට වැදගත් වූ සාම්ප්‍රදායික ප්‍රදේශවලින් බැහැරට යමින් සාම්ප්‍රදායික නොවන ප්‍රදේශවල රබර් වගාව ප්‍රචලිත වෙමින් දේශීය ආර්ථිකය ශක්තිමත් කරන බවක් විද්‍යමාන වේ. රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ සහනාධාර යටතේ සිදු කරනු ලබන රබර් නව වගාවට අමතරව කුඩා තේ හා රබර් වතු පුනර්ජීවන ව්‍යාපෘතිය යටතේ ද රබර් නව වගාව සිදු කරනු ලබයි.

කුඩා තේ හා රබර් වතු පුනර්ජීවන ව්‍යාපෘතිය දිස්ත්‍රික්ක 08 ක් තුළ ක්‍රියාත්මක වේ. එය මාතර, ගාල්ල, රත්නපුර, නුවරඑළිය, මහනුවර හා බදුල්ල දිස්ත්‍රික්ක 06 තුළ තේ වගාව ද මොනරාගල හා අම්පාර දිස්ත්‍රික්ක දෙක තුළ රබර් වගාව ද වශයෙනි. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වනුයේ කෘෂිකර්මාන්තය සඳහා වන අන්තර්ජාතික අරමුදලේ (IFAD) හා ශ්‍රී ලංකා රජයේ මූල්‍ය දායකත්වය යටතේ ය.

මෙම ව්‍යාපෘතිය තුළින් මූලික වශයෙන් ඉලක්ක කෙරෙනුයේ ග්‍රාමීය දිළිඳු ජනතාවගේ ආදායම ඉහළ නැංවීම තුළින් ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් කරලීමයි. සාම්ප්‍රදායික නොවන ප්‍රදේශයන් වන අම්පාර, මොනරාගල ප්‍රදේශවල හෙක්. 3000 ක රබර් වගා කිරීම ඉලක්ක කොට ගනිමින් ඒ යටතේ රබර් ගොවීන් හට නව වගාව සඳහා සහනාධාර ලබාදීමත්, රජයේ පැළ තවානක් වන පදියතලාව රබර් පැළ තවානේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට මූල්‍ය ආධාර ලබාදීමත්, කුඩා තේ හා රබර් වතුවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට මූල්‍ය ආධාර ලබාදීමත් මෙම ව්‍යාපෘතිය යටතේ සිදු කෙරෙන ප්‍රධාන කාර්යයන් වේ.

රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව හා රබර් පර්යේෂණ ආයතනය මගින් මෙම ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය තාක්ෂණික සහය ලබා දෙන අතර ව්‍යාපෘතියේ කාල සීමාව 2016 – 2022 දක්වා වේ.
කුඩා තේ හා රබර් වතු පුනර්ජීවන ව්‍යාපෘතියේ වාර්තාවලට අනුව අම්පාර හා මොනරාගල දිස්ත්‍රික්කවල 2016 සිට 2020 දක්වා වාර්ෂිකව රබර් නව වගාව සිදු කළ ආකාරය පහතින් දක්වා ඇත. මෙම ව්‍යාපෘතිය 2016 වර්ෂයේ දී ආරම්භ කළ අතර එම වර්ෂයේ පටන් රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ මොනරාගල ප්‍රාදේශීය කාර්යාලය මගින් රබර් වගාව අධීක්ෂණය කරනු ලැබූ අතර අදාළ වැයබර දරන ලද්දේ ව්‍යාපෘතිය මගිනි.

වර්ෂය	වගා කළ බිම් ප්‍රමාණය (හෙක්.)		වැය කළ මුදල (රු.මි.)		වගා කරන ලද ගොවීන් සංඛ්‍යාව	
	අම්පාර	මොනරාගල	අම්පාර	මොනරාගල	අම්පාර	මොනරාගල
2016	55	197	-	16.00	71	327
2017	7	315	-	11.60	11	561
2018	224	407	7.92	64.91	380	725
2019	317	573	62.80	96.33	465	1,023
2020	196	333	118.06	268.67	344	652
2021 ඉලක්කය	200	178	257.38	217	500	445

වගු අංක IX

ශ්‍රී ලංකාවේ රබර් නව වගාව සිදුකල මුළු බිම් ප්‍රමාණය පහත වගුවේ දක්වා ඇත.

රබර් නව වගා බිම් ප්‍රමාණය (2012 – 2020)

වර්ෂය	කුඩා වතු	වැවිලි සමාගම්	එකතුව
2012	2,297	1,086	3,383
2013	2,979	912	3,891
2014	1,428	133	1,561
2015	769	56	825
2016	592	23	615
2017	700	335	1,035
2018	981	48	1,029
2019	1,103	-	1,103
2020	726	25	751

වගු අංක X

වගා සහනාධාර ගෙවීම්

රබර් නැවත වගා සහනාධාරය ක්‍රියාත්මක කිරීමේ මූලික අරමුණ වනුයේ ඵලදායීත්වයෙන් අඩු පැරණි රබර් වගාවන් ඉවත් කර එම ඉඩමේ නැවත ඵලදායීතාවයෙන් වැඩි ක්ලෝනවලින් යුතු නව රබර් වගාවක් ඇති කිරීම වේ. රබර් නව වගා කිරීමේ සහනාධාරය ක්‍රියාත්මක කිරීම තුළින් රබර් වගා බිම් ප්‍රමාණය ඉහළ දැමීම, වගා ව්‍යාප්තිය වැඩිකිරීම මඟින් නිෂ්පාදනය ඉහළ නැංවීම අපේක්ෂා කෙරේ.

සහනාධාර ක්‍රමය යටතේ රබර් නැවත වගාව හෝ නව වගාව කිරීම සඳහා 1953 අංක 36 දරණ රබර් නැවත වගා කිරීමේ පනතේ 07 වැනි වගන්තිය අනුව අවසර පත්‍රයක් ලබාගත යුතුය. මෙම පනත අනුව සියලු රබර් ඉඩම් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි විය යුතු වේ. ලියාපදිංචි වූ රබර් ඉඩමක පවතින වගාවේ වයස අවු 20 ඉක්ම වූ පසු එම ඉඩමේ සහනාධාර ක්‍රමය යටතේ නැවත වගා කිරීම සඳහා බලපත්‍රයක් ලැබීමට සුදුසුකම් ලැබේ.

රබර් වගාවේ නිරත වන්නන් තව දුරටත් දිරි ගැන්වීම සඳහා හෙක්ටයාරයකට ලබාදෙන සහනාධාර මුදල 2019.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි දෙගුණයකින් වැඩි කර පහත පරිදි ලබාදෙනු ලැබේ.

නව වගාව සඳහා හෙක්ටයාරයකට රු. 300,000.00

නැවත වගාව සඳහා හෙක්ටයාරයකට රු. 350,000.00

මෙම සහනාධාර මුදල වාරික 08 කින් ගෙවනු ලබයි.

සමාලෝචනයට භාජනය වන 2020 වසර තුළ පහත දැක්වෙන පරිදි ඒ ඒ වගාවන් සඳහා සහනාධාර ගෙවීමට දෙපාර්තමේන්තුව කටයුතු කර ඇත.

රබර් වගාව සඳහා සහනාධාර ගෙවීම

වැඩ සටහන්	ගෙවූ මුදල (රු.මි.)
2020 නැවත වගා සහනාධාර (කුඩා වතු)	259.39
2020 නැවත වගා සහනාධාර (වැවිලි සමාගම්)	181.36
2020 නව වගා සහනාධාර (කුඩා වතු)	117.69
එකතුව	558.44

වගු අංක XI

2.3. රබර් පැළ නිෂ්පාදනය

2.3.1. රජයේ පැළ තවාන්

රටේ ආර්ථික සංවර්ධනය සඳහා රබර් වගාවේ දායකත්වය වැඩි කිරීම දෙපාර්තමේන්තුවේ මුඛ්‍ය පරමාර්ථය වේ. ඒ වෙනුවෙන් රබර් නිෂ්පාදනයේ ඵලදායීතාවය වර්ධනය කිරීම උදෙසා උසස් තත්ත්වයේ ක්ලෝනවලින් යුතු සාර්ථක රබර් පැල නිපදවීම අත්‍යවශ්‍ය වේ. ඒ අනුව 2020 වර්ෂයට අදාළව නැවත වගා හා නව වගා ඉලක්කයන් හඳුනා ගනිමින් ඒ සඳහා අවශ්‍ය රබර් පැල නිෂ්පාදනය

කිරීම පැල තවාන් මඟින් සිදු කරනු ලැබේ. මේ සඳහා රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ පැල තවාන් **08** ක් ස්ථාපනය කර පැල නිෂ්පාදනය මෙන්ම පැල බෙදා හැරීම ද සිදු කරනු ලැබේ.



මොනරාගල -කුඹුක්කන රබර් පැල තවාන



කළුතර ගුරුගොඩ රබර් පැල තවාන



අම්පාර පදියතලාව රබර් පැල තවාන



ගම්පහ වැලිකඩමුල්ල රබර් පැල තවාන



කළුතර - ඇගල්ඔය රබර් පැල තවාන

රජයේ පැළ තවාන්හි පැල නිෂ්පාදනය සහ පැල බෙදා හැරීම - 2020

තවානේ නම	තවාන පිහිටි දිස්ත්‍රික්කය	ඉලක්කය	පැල නිෂ්පාදනය 2020	පැල බෙදාහැරීම 2020
ගුරුගොඩ	කළුතර	200,000	108,749	140,887
ඇගල්ඔය	කළුතර	200,000	87,152	95,345
වැලිකඩමුල්ල	ගම්පහ	200,000	145,174	179,490
මීරිගම	ගම්පහ	50,000	11,550	3,620
කුඹුක්කන	මොනරාගල	300,000	407,263	348,767
පදියතලාව	අම්පාර	75,000	114,543	75,617
කරපිංව	රත්නපුර	75,000	103,048	68,845
මිද්දෙනිය	හම්බන්තොට	75,000	49,420	64,932
එකතුව		1,175,000	1,026,899	977,503

වගු අංක XII

ඒ අනුව 2020 වර්ෂයේ පැල 1,175,000 ක නිෂ්පාදන ඉලක්කයක් හමුවේ රබර් පැල 1,026,899 ක් සාර්ථකව නිෂ්පාදනය කරමින් 87% ක භෞතික ප්‍රගතියක් වෙත ළඟා වීමට දෙපාර්තමේන්තුව සමත් වී ඇත. ඒ සඳහා ඒ ඒ තවාන්වලින් ලද දායකත්වය පහත ප්‍රස්තාරය මඟින් දක්වා ඇත.

ප්‍රස්තාර අංක iii

රජයේ පැළ තවාන්හි පැල නිෂ්පාදනය



මෙහි දී 2020 වර්ෂය තුළ ඉහළ පැල නිෂ්පාදනයක් සිදු කර ඇත්තේ වැලිකඩමුල්ල හා කුඹුක්කන තවාන් මඟිනි. එම තවාන් දෙක සමස්ථ රබර් පැල නිෂ්පාදනයට පැල 552,437 ක් එකතු කරමින් 54% ක දායකත්වයක් ලබා දීමට සමත්ව ඇත. රජයේ පැල තවාන්හි පැල නිෂ්පාදන ඉලක්කය මුදුන් පමුණුවා ගැනීම සඳහා වෙන් කරන ලද රු. මි 132 කින් රු.මි 123.7 ක් වැය කර 94% ක මූල්‍ය ප්‍රගතියක් ළඟා කර ගෙන ඇත. පෙර වර්ෂ කිහිපයක රජයේ පැල තවාන්හි වාර්ෂික පැල නිෂ්පාදනය පහත වගුව තුළ සටහන්ව ඇත.

වර්ෂය	පැළ නිෂ්පාදනය
2015	1,386,593
2016	1,204,748
2017	946,805
2018	1,327,180
2019	1,454,004
2020	1,026,899

වගු අංක XIII

සංඛ්‍යාලේඛන අනුව 2015 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා පැල නිෂ්පාදනය ක්‍රමයෙන් පහළ බැසීමක් දැක ගත හැකි අතර 2018 සිට 2019 වර්ෂය දක්වා පැල නිෂ්පාදනයේ වර්ධනයක් පෙන්නුම් කරයි. එනමුත් 2019 වර්ෂයේ නිෂ්පාදිත පැල සංඛ්‍යාව සමඟ සැසඳීමේ දී 2020 වර්ෂයේ පැල නිෂ්පාදනය පහත වැටීමක් සිදුව ඇත. එම අඩු වීම රබර් පැල 427,105 කි.

2.3.2. පැල නිෂ්පාදනය - පෞද්ගලික පැල තවාන්

පැල අවශ්‍යතාවය සපුරාලීම උදෙසා පවත්වාගෙන යනු ලබන රජයේ පැල තවාන්වලට අමතරව පෞද්ගලික පැල තවාන් ද ස්ථාපිතව ඇත. පෞද්ගලික පැල තවාන් දෙපාර්තමේන්තුවේ සහ රබර් පර්යේෂණ ආයතනයේ අධීක්ෂණයට ලක් වන අතර 2020 වර්ෂයේ ප්‍රාදේශීය කාර්යාල වශයෙන් පෞද්ගලික පැල තවාන්හි පැල නිෂ්පාදනය පහත වගුව තුළින් පෙන්වා දී ඇත.

පැල නිෂ්පාදනය - 2020 (පෞද්ගලික පැල තවාන්)

ප්‍රාදේශීය කාර්යාලය	පැල නිෂ්පාදනය
කෑගල්ල	174,640
මොනරාගල	27,277
රත්නපුර	139,950
කළුතර	7,788
ගාල්ල	**13,500**
එකතුව	**363,155**

වගු අංක XIV

ඉහත වගුවට අනුව 2020 වර්ෂයේ සමස්ථ රබර් පැල නිෂ්පාදනය තුළ ඉහළම පැල නිෂ්පාදනයක් වාර්තා වන්නේ කෑගල්ල ප්‍රාදේශීය කාර්යාල බල ප්‍රදේශයෙනි. කෑගල්ල සහ රත්නපුර යන දිස්ත්‍රික්කයන් පෞද්ගලික අංශයේ සමස්ථ රබර් පැල නිෂ්පාදනය සඳහා 87% ක දායකත්වයක් ලැබී ඇත.

2.4. වැසි ආවරණ යෙදීමේ වැඩසටහන

ශ්‍රී ලංකාවේ රබර් වගාව ආරම්භ කළ මුල් අවධියේ සිටම වර්ෂාව, රබර් කිරි අස්වනු නෙළා ගැනීමට (කිරි කැපීමට) බාධාකාරී සාධකයක් වී ඇත. වර්ෂා කාලයේ දී රබර් කිරි අපතේ යාම වැළැක්වීම හා වර්ෂාව රහිත කාලයේ මෙන්ම වර්ෂාව සහිත කාලයේ දී ද අඛණ්ඩව රබර් කිරි අස්වැන්න ලබා ගැනීම සඳහා වැසි ආවරණ යෙදීම යන නව තාක්ෂණික ක්‍රමවේදය ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය මඟින් රබර් වගාකරුවන්ට හඳුන්වා දී ඇත. වැසි ආවරණ යෙදීම මඟින් වර්ෂාව නිසා කිරි කැපීමට නොහැකි දිනවල දී ද කිරි කැපීම තුළින් රබර් ගොවීන් හට ආදායම් ලබා ගැනීමට හැකි වීම මෙහි ඇති සුවිශේෂී වාසියකි. වැසි ආවරණ යෙදීම රබර් වගාකරුවන් අතරේ ප්‍රචලිත කිරීම සඳහා රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සහනාධාර මුදල් ඉඩම් හිමියන් වෙත ලබාදෙයි. සාර්ථකව වැසි ආවරණ යොදා ඇති කුඩා ඉඩම් හිමියන්ගේ එක් රබර් ගසකට රු. 70/- බැගින් සහනාධාර මුදලක් කුඩා රබර් වතු හිමියන් සඳහා ද ගසකට රු. 35/- ක මුදලක් වැවිලි සමාගම් වෙතද ගෙවනු ලැබේ., සාම්ප්‍රදායික ප්‍රදේශ තුළ, වර්ෂය පුරාම පවතින වර්ෂාපතනය හේතුවෙන් මෙම වැඩසටහන ක්‍රියාත්මක කෙරේ.



වැසි ආවරණ යොදන ලද රබර් වගාවක්

2020 වර්ෂයේ කුඩා වතු අංශයට අදාළව වැසි ආවරණ යෙදීම සම්බන්ධ තොරතුරු සඳහා පහත වගුවෙන් දැක්වේ.

දිස්ත්‍රික්කය	වැසි ආවරණ යෙදූ බිම් ප්‍රමාණය - කුඩා වතු (හෙක්ටයාර්)	වැසි ආවරණ යෙදූ ගොවීන් සංඛ්‍යාව
කළුතර	166.58	128
කෑගල්ල	217.36	170
ගම්පහ	68.15	27
කුරුණෑගල	41.87	26
මහනුවර	5.25	14
මාතලේ	2.53	02
රත්නපුර	192.74	160
කොළඹ	78.48	41
ගාල්ල	60.40	51
මාතර	98.45	82
හම්බන්තොට	9.89	12
එකතුව	941.70	713

2020 වර්ෂයේ දී වැසි ආවරණ යෙදීමේ වැඩසටහන යටතේ කුඩා වතු සඳහා ගොවීන් 713 දෙනෙකු විසින් හෙක්. 941.70 ක වැසි ආවරණ යොදන ලදී. රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් මේ සඳහා සහනාධාර වශයෙන් රු.මි. 38.02 ක් වැය කර ඇත. මෙම වසරේ කුඩා වතු අංශයේ වැසි ආවරණ යෙදීම දිස්ත්‍රික්ක වශයෙන් පහත ප්‍රස්තාර සටහන තුළින් නිරූපණය කර ඇත.

ප්‍රස්තාර අංක iv

දිස්ත්‍රික්ක වශයෙන් වැසි ආවරණ යොදන ලද බිම් ප්‍රමාණය - 2020 (කුඩා වතු)



මෙහි දී ගම්‍ය වනුයේ 2020 වර්ෂයේ දී දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද වැසි ආවරණ යෙදීමේ වැඩසටහන යටතේ කුඩා වතු අංශය තුළ අනෙකුත් දිස්ත්‍රික්ක අභිභවා කෑගල්ල දිස්ත්‍රික්කය ඉහළ ප්‍රගතියක් අත් කර ගෙන ඇති බවයි. කෑගල්ල දිස්ත්‍රික්කයේ වැසි ආවරණ යොදන ලද බිම් ප්‍රමාණය හෙක්. 217.36 කි.

වැවිලි සමාගම් විසින් 2020 වසරේ දී රබර් වගාව සඳහා වැසි ආවරණ යෙදීම පිළිබඳ තොරතුරු පහත වගුව තුළින් නිරූපණය වේ.

දිස්ත්‍රික්කය	වැසි ආවරණ යෙදූ බිම් ප්‍රමාණය වැවිලි සමාගම් (හෙක්ටයාර්)	වැසි ආවරණ යෙදූ වතු සංඛ්‍යාව
කළුතර	1,706.61	04
කෑගල්ල	1,583.01	30
කුරුණෑගල	378.97	04
මහනුවර	20.00	03
රත්නපුර	1,366.83	18
කොළඹ	610.16	06
ගාල්ල	183.01	07
මාතර	98.18	02
එකතුව	5,946.77	74

වගු අංක XVI

ඒ අනුව 2020 වසරේ දී වැවිලි සමාගම්වල වතු 74 ක් මගින් හෙක්. 5,946.77 ක භූමි ප්‍රමාණයක වැසි ආවරණ යෙදීම සිදු කර ඇති අතර ඒ වෙනුවෙන් වැය කරන මුදල රු.මී. 50.94 කි.

වැවිලි සමාගම් අංශයේ වැසි ආවරණ යෙදීමේ වැඩසටහන යටතේ අනෙකුත් දිස්ත්‍රික්ක අතරින් කළුතර දිස්ත්‍රික්කයේ ඉහළම වැසි ආවරණ යෙදීම වාර්තා වූ අතර එම බිම් ප්‍රමාණය හෙක්. 1,706.61 කි. වාර්ෂිකව වැසි ආවරණ යෙදීමේ ප්‍රගතිය පහත පරිදි හඳුනා ගත හැකි වේ.

වැසි ආවරණ යෙදීම 2015 - 2020

වර්ෂය	කුඩා වතු බිම් ප්‍රමාණය (හෙක්.)	වැවිලි සමාගම් බිම් ප්‍රමාණය (හෙක්.)
2015	478.58	3,778.29
2016	182.65	2,452.52
2017	258.88	1,072.79
2018	323.71	1,071.32
2019	434.43	2,454.94
2020	941.70	5,946.77

වගු අංක XVII

මේ අනුව, පෙර වර්ෂ සමග සැසඳීමේ දී 2020 වර්ෂයේ වැසි ආවරණ යොදන ලද බිම් ප්‍රමාණයේ සීඝ්‍ර වර්ධනයක් සිදුව ඇති බව පෙනේ. වැසි ආවරණ යෙදීම පිළිබඳ ගොවීන් වඩාත් දැනුවත් වීම හා වර්ෂය පුරාවට රබර් අස්වැන්න නෙලා ගත හැකි වීම තුළින් ඔවුනට ඉහළ ඵලදාවක් අත් කර ගත හැකි වීම ඒ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.

2.5. කිරි කැපුම් ශිල්පී පුහුණු වැඩසටහන

i. කිරි කැපුම් ශිල්පී පුහුණුව ලබා දීම (සාමාන්‍ය)

දිගු කාලීනව ඉහළ රබර් අස්වැන්නක් ලබා ගැනීමට නම් නිවැරදි ශිල්පීය ක්‍රම අනුගමනය කරමින් කිරි කැපීම සිදු කළ යුතු ය. ඒ සඳහා ගොවීන් පුහුණු කිරීම දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබයි. ස්වයං රැකියා අවස්ථා ඇති කිරීම, රබර් ගසට හානියක් සිදු නොවන පරිදි දිගු කාලයක් වැඩි අස්වැන්නක් ලබා ගැනීම පිළිබඳව දැනුවත් කිරීම සහ කිරි අස්වනු සහයකයින්ගේ හිඟයට පිළියමක් යෙදීම මෙම වැඩසටහන තුළින් අපේක්ෂා කෙරේ.



කිරි කැපුම් ශිල්පී පුහුණු අවස්ථාවක්

කිරි කැපුම් ශිල්පී පුහුණුව සාමාන්‍ය සහ වෘත්තීය වශයෙන් කොටස් දෙකක් යටතේ සිදු කරනු ලබයි. කිරි කැපුම් ශිල්පී සාමාන්‍ය පුහුණුව යටතේ රබර් සංවර්ධන නිලධාරී කොට්ඨාශ මට්ටමින් කුඩා රබර් වතු හිමියන් සඳහා තමන්ගේම වගාවක් පවත්වා ගෙන යන්නේ නම් එහි ඵලදාව ලබා ගැනීමට තමාටම හැකියාව ඇති කිරීමටත්, වෘත්තියක් ලෙස එම කාර්යයයේ යෙදීමටත් මෙම වැඩසටහන පවත්වන අතර පුහුණුවන්නන් වෙත රබර් කර්මාන්තය ආශ්‍රිත ආර්ථික, පාරිසරික හා සමාජීය වැදගත්කම, ගස තෝරා ගැනීම, රබර් ගසේ පටක හඳුනා ගැනීම, කැපුම් ක්‍රම හඳුන්වා දීම, රබර් සැකසීම සම්බන්ධයෙන් දැනුම මෙන්ම කිරි පිහිය මුවහත් කිරීම, නිදහස් කිරි කැපීම, කැපුම් සලකුණු කිරීම, සලකුණු ඔස්සේ කිරි කැපීම, වැසි ආවරණ සවි කිරීම වැනි ක්ෂේත්‍ර පිළිබඳව ප්‍රායෝගික පුහුණුවක් ද ලබා දේ. 2020 වර්ෂයේ කිරි කැපුම් ශිල්පී සාමාන්‍ය පුහුණු වැඩසටහන සම්බන්ධ තොරතුරු පහත වගුවෙහි දක්වා ඇත.

ප්‍රාදේශීය කාර්යාලය	කිරි කැපුම් ශිල්පී පුහුණු වැඩසටහන (සාමාන්‍ය)			
	ඉලක්කය (පුද්ගලයින්)	පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව	පුහුණුව ලැබූ සංඛ්‍යාව	වැය වූ මුදල (රු. මි)
කළුතර	560	11	235	0.37
කෑගල්ල	920	37	741	1.18
රත්නපුර	620	18	620	0.63
මොනරාගල	580	37	580	0.99
ගාල්ල	240	10	135	0.40
එකතුව	2,920	113	2,311	3.57

වගු අංක XVIII

2020 වර්ෂයේ දී පුද්ගලයින් 2,920 ක් සඳහා කිරි කැපුම් ශිල්පී සාමාන්‍ය පුහුණුව ලබා දීමට ඉලක්ක කළ ද පුහුණුව ලබා දීමට හැකි වූයේ පුද්ගලයින් 2,311 ක් සඳහා පමණක් වූ අතර එමගින් 79% ක භෞතික ප්‍රගතියක් ළඟා කර ගෙන ඇත. මෙම වැඩසටහන සඳහා දෙපාර්තමේන්තුව විසින් රු. මි 3.57 ක් වැය කර ඇත. කිරි කැපුම් ශිල්පී සාමාන්‍ය පුහුණුව ප්‍රාදේශීය කාර්යාල මට්ටමින් ඉලක්කයන් ළඟා කර ගත් ආකාරය පහත ප්‍රස්තාර සටහන තුළින් තව දුරටත් විග්‍රහ කර ඇත.

ප්‍රස්තාර අංක v

කිරි කැපුම් ශිල්පී පුහුණුව ලබා දීම (සාමාන්‍ය)



මේ අනුව රත්නපුර සහ මොනරාගල ප්‍රාදේශීය කාර්යාලය ඉලක්කය සම්පූර්ණ කර ඇති අතර 2020 වසරේ දී වැඩි පුද්ගල සංඛ්‍යාවක් පුහුණු කර ඇත්තේ කෑගල්ල ප්‍රාදේශීය කාර්යාලය මඟිනි.

ii. කිරි කැපුම් ශිල්පී පුහුණුව ලබා දීම (වෘත්තීය)

දැනට කිරි කැපීම පිළිබඳ පුහුණුවක් සහ අත්දැකීමක් සහිත කිරි කැපුම්කරුවන්, කිරි කැපීම් පුහුණුව සඳහා උනන්දුවක් දක්වන පුද්ගලයින් වෙත වෘත්තීයමය කුසලතාවයක් ලබා දීම කිරි කැපුම් ශිල්පී වෘත්තීය පුහුණුව මගින් සිදු කරයි. මෙහි දී රබර් කර්මාන්තය පිළිබඳව හා එහි ආර්ථික හා පාරිසරික වැදගත්කම, රබර් ගසේ පොත්තේ ව්‍යුහය, රබර් ගසක කිරි නිෂ්පාදන ක්‍රියාවලිය, රබර් කිරිවල සංයුතිය, කිරි කැපීමේ ආරම්භය, ගස සලකුණු කිරීම, රබර් ගසක පටක පිහිටීම, කිරි කැපීම සඳහා භාවිතා කරන උපකරණ හා තාක්ෂණයෙන් වැඩි දියුණු කරන ලද කිරි පිහිය හඳුන්වා දීම, අපරිණත රබර් වගාවක් ස්ථාපනය සහ වගා පාලනය, පොහොර භාවිතය, වැළඳෙන රෝග හා පළිබෝධ හඳුනා ගැනීම හා පාලනය, කිරි කැපීමේ නිර්දේශිත ක්‍රම, උත්තේජන භාවිතය, උත්ප්‍රේරක භාවිතය, කිරි කැපීම ප්‍රායෝගික පුහුණුව, ශාකයේ උද්භිද විද්‍යාත්මක ලක්ෂණ සහ ක්ලෝන වර්ග, වැසි ආවරණ භාවිතය, අතුරු භෝග හා මී මැසි පාලනය යනාදිය පිළිබඳ පුළුල් දැනුමක් ලබා දේ. 2020 වර්ෂයට අදාළව කිරි කැපුම් ශිල්පී වෘත්තීය පුහුණු වැඩසටහන සම්බන්ධ තොරතුරු පහතින් දැක්වේ.

ප්‍රාදේශීය කාර්යාලය	කිරි කැපුම් ශිල්පී පුහුණු වැඩසටහන (වෘත්තීය)			
	ඉලක්කය (පුද්ගලයින්)	පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව	පුහුණුව ලැබූ සංඛ්‍යාව	වැය වූ මුදල (රු. මි.)
කළුතර	60	01	30	0.26
කෑගල්ල	60	02	60	0.13
රත්නපුර	60	02	67	0.45
මොනරාගල	60	01	30	0.25
ගාල්ල	60	01	25	0.25
එකතුව	300	07	212	1.34

වගු අංක XIX

දෙපාර්තමේන්තුව විසින් 2020 වර්ෂයට අදාළව පුද්ගලයින් 300 ක් සඳහා කිරිකැපුම් ශිල්පී වෘත්තීය පුහුණු පාඨමාලාව ලබා දීමට ඉලක්ක පමුණුවා ගත්ත ද පුහුණුව ලබා දුන් පුද්ගලයින් සංඛ්‍යාව 212 කි. මෙම පුහුණු වැඩසටහන වෙනුවෙන් රු.මි 1.34 ක් වැය කර ඇත. ප්‍රාදේශීය කාර්යාල මට්ටමින්, කිරිකැපුම් ශිල්පී වෘත්තීය පුහුණුව යටතේ පුහුණු කරන ලද පුහුණුකරුවන් සංඛ්‍යාව පහත ප්‍රස්තාර සටහන තුළින් නිරූපණය වේ.

ප්‍රස්තාර අංක vi

කිරි කැපුම් ශිල්පී පුහුණුව ලබා දීම (වෘත්තීය)



පසුගිය වසර කිහිපයක කිරිකැපුම් ශිල්පී පුහුණු තොරතුරු පහතින් ඉදිරිපත් කර ඇත.

වර්ෂය	සාමාන්‍ය කිරිකැපුම් ශිල්පී පුහුණුව ලබාගත් සංඛ්‍යාව	වෘත්තීය කිරිකැපුම් ශිල්පී පුහුණුව ලබාගත් සංඛ්‍යාව
2016	2,480	305
2017	2,903	287
2018	3,117	268
2019	3,997	300
2020	2,311	212

වගු අංක XX

පෙර වර්ෂවලට සාපේක්ෂව 2020 වර්ෂයේ දී කිරි කැපුම් ශිල්පී පුහුණුකරුවන් සංඛ්‍යාවේ පහළ යාමක් සිදුව ඇති බවට උක්ත වගුව සාක්ෂි දරයි. පැවති කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ පුහුණු වැඩ සටහන් නොපැවැත්වීම ඒ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.

2.6. බද්ධකරුවන් පුහුණු වැඩසටහන

ඵලදායීතාවයෙන් ඉහළ උසස් තත්ත්වයේ බද්ධ රබර් පැළ නිෂ්පාදනය කිරීමට පුහුණු කිරීම මෙම වැඩසටහනේ මුඛ්‍ය පරමාර්ථය වේ. පැළයක් සිටුවා වසර පහේ සිට වසර 30 ක් දක්වා ඉහළ අස්වැන්නක් ලබාගත හැකි වන්නේ සාර්ථක බද්ධ පැළයක් තුළින් පමණක්ම වන අතර රජයේ පැළ තවාන්වල සේවකයින්, පුද්ගලික පැළ තවාන්කරුවන් හා ඊට ඉල්ලුම් කරනු ලබන පුද්ගලයින් සහභාගී කරවා ගනිමින් බද්ධකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන සිදු කරනු ලබයි. 2020 වර්ෂයට අදාළව මෙම වැඩසටහන සම්බන්ධ තොරතුරු පහත වගුවෙහි දක්වා ඇත.

ප්‍රාදේශීය කාර්යාලය	බද්ධකරුවන් පුහුණුව		
	ඉලක්කය (පුද්ගලයින්)	පුහුණු කල සංඛ්‍යාව	වැය වූ මුදල (රු.මි)
කළුතර	30	28	0.03
කෑගල්ල	60	68	0.05
රත්නපුර	30	30	0.05
මොනරාගල	60	60	0.08
ගාල්ල	30	25	0.05
එකතුව	210	211	0.26

වගු අංක XXI

2020 වර්ෂයේ දී ඉලක්කගත පුහුණු බද්ධකරුවන් සංඛ්‍යාව 210 ක් වූ අතර එම ඉලක්කය සාර්ථකව ළඟා කර ගැනීමට දෙපාර්තමේන්තුවට හැකියාව ලැබී ඇත. මෙම වැඩසටහන වෙනුවෙන් වෙන් කළ

රු.මී 0.35 කින් රු.මී. 0.26 ක් වැය කර 74% ක මූල්‍ය ප්‍රගතියක් අත් කර ගැනීමට දෙපාර්තමේන්තුව සමත්ව ඇත.

මෙහි දී ඉලක්කගත පුහුණුකරුවන් සංඛ්‍යාව සපුරා ගැනීමට කෑගල්ල, රත්නපුර සහ මොනරාගල ප්‍රාදේශීය කාර්යාල සමත් වූ අතර වැඩිම පුද්ගලයින් සංඛ්‍යාවක් පුහුණු කර ඇත්තේ කෑගල්ල ප්‍රාදේශීය කාර්යාලය මඟිනි.

2.7. වැසි ආවරණ යෙදීමට පුහුණු කිරීමේ වැඩසටහන

වැසි ආවරණ යෙදීම යන්න නිවැරදිව සිදු කළ යුතු වැදගත් කාර්යයක් වන අතර එය නිසි පරිදි සිදු නොවුනහොත් රබර් ගස විනාශ වීම හේතුවෙන් එහි ඵලදාව කාර්යක්ෂමව ලබා ගැනීමට නොහැකි වීමේ ගැටලුවකට මුහුණ පෑමට ගොවීන් හට සිදු වේ. එවැනි තත්ත්වයකට ප්‍රධාන හේතු සාධකය වන්නේ වැසි ආවරණ යෙදීම සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම රහිත පුද්ගලයින් විසින් එම කාර්යය සිදු කිරීමයි. ඒ අනුව රබර් වගාවන් සඳහා නිවැරදි හා සාර්ථක වැසි ආවරණයක් යෙදීම තුළින් ඉහළ ඵලදාවක් ලබා ගැනීමේ මූලික අරමුණ ඇතිව මෙම පුහුණු වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබේ. අදාළ වර්ෂය තුළ වැසි ආවරණ යෙදීමේ පුහුණුව පුද්ගලයින් 510 ක් සඳහා ලබා දීමට ඉලක්ක වූ අතර පුද්ගලයින් 1231 ක් සඳහා පුහුණුව ලබා දෙමින් වැඩසටහන සාර්ථකව නිමා කිරීමට හැකියාව ලැබී ඇත.

ප්‍රාදේශීය කාර්යාලය	ඉලක්කය (පුද්ගලයින්)	පුහුණු කල සංඛ්‍යාව	වැය වූ මුදල (රු.මී)
කෑගල්ල	**270**	245	**0.15**
කළුතර	120	139	**0.09**
රත්නපුර	90	134	**0.10**
ගාල්ල	**30**	**713**	**0.001**
එකතුව	**510**	**1231**	**0.341**

වගු අංක **XXII**

වගුව අනුව රබර් ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා ක්‍රියාත්මක වූ වැහි ආවරණ යෙදීමට පුහුණු කිරීමේ වැඩසටහන යටතේ ප්‍රාදේශීය කාර්යාල අතරින් ගාල්ල ප්‍රාදේශීය කාර්යාලය පුද්ගලයින් 713 ක් සඳහා පුහුණුව ලබා දෙමින් ඉහළම ප්‍රගතියක් ලබා ගෙන ඇත. ඉහත පුහුණු වැඩසටහන්වලට අමතරව,

- ගෘහාශ්‍රිත රබර් භාණ්ඩ නිෂ්පාදන පුහුණුව
- පාංශු රක්ෂණ පුහුණුව
- අපරිනත හා පරිනත වගා නඩත්තු පුහුණුව
- දුම් ගෙවල් ඉදි කිරීම
- කිරි කැපීම සම්බන්ධ දෙදින වැඩමුළුව
- රබර් වගාව පිළිබඳ දැනුවත් කිරීමේ එක් දින වැඩමුළුව
- ගොවිපළ ඒකක සංවර්ධනය
- මී මැසි පාලනය පිළිබඳ පුහුණුව
- ආදර්ශ ගොවිපළ ඒකක ඇති කිරීම
- රබර් ෂීට් නිෂ්පාදන පුහුණුව
- රබර් ෂීට් නිෂ්පාදනය පිළිබඳ එක් දින වැඩමුළුව

වැනි පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කළ අතර මේ අතරින් ඉහළම පුහුණුකරුවන් සංඛ්‍යාවක් පුහුණු කරනු ලැබ ඇත්තේ රබර් ෂීට් නිෂ්පාදන පුහුණු වැඩසටහන මඟිනි. ඒ තුළින් පුහුණු කරන ලද සංඛ්‍යාව 255 කි.

2.8. අතුරු භෝග වගාව



අතුරු භෝග වගා කරන ලද රබර් ඉඩමක්

රබර් වගාවේ අපරිනත අවස්ථාවේ දී අමතර ආදායමක් උපයා දීම තුළින් වගාකරුවන්ගේ ජීවන තත්ත්වය තවදුරටත් උසස් කිරීම අතුරු භෝග වගාව හඳුන්වා දීමේ පරමාර්ථය වේ. ඵලදායීව හා කාර්යක්ෂමව භූමි භාවිතය ඉහළ දැමීම, රබර් වගාව අතර විවිධ වර්ගයේ වල් පැළෑටි රබර් ගසේ වර්ධනයට සෘනාත්මක බලපෑම් ඇති කරන අතර ඒවා මර්ධනය කිරීම, ස්වාභාවික සම්පත් හා අනෙකුත් යෙදවුම් කාර්යක්ෂමව භාවිතා කිරීම (හිරු එළිය, පොහොර, ජලය භාවිතය, පසේ සරු සාර බව, ශ්‍රමිකයන්) සහ එකවිට සියලුම භෝග වගාවන් විනාශ නොවීම නිසා වගාකරුවන්ගේ පැවැත්මට එය යහපත් පරිදි බලපෑම වැනි ධනාත්මක සාධක අතුරු භෝග වගාව තුළින් රබර් වගා කරුවන්ට අත් කර ගත හැකි වේ. මේ යටතේ අන්නාසි, කෙසෙල්, වැල් දොඩම් හා ගස්ලබු සාම්ප්‍රදායික ප්‍රදේශ සඳහාත් කොකෝවා, කෙසෙල් හා ගස්ලබු සාම්ප්‍රදායික නොවන ප්‍රදේශ සඳහාත් හඳුන්වා දී ඇති අතර මෑත කාලයේ දී ඉරිඟු වගාව ඇතුළු කන්න භෝග ද හඳුන්වා දී ඇත. රබර් පර්යේෂණායතනයේ නිර්දේශිත ආකාරයට සාර්ථකව වගා කරන ලද අතුරු භෝග සහිත රබර් වගාවක් සඳහා අක්කරයකට රු. 4,000/- ක සහනාධාර මුදලක් ගෙවනු ලැබේ.

දිස්ත්‍රික්කය	වගා කළ භෝගය	වගා කළ බිම් ප්‍රමාණය (හෙක්ටයාර්)	වගා කළ ගොවීන් ගණන
කළුතර	අන්නාසි	13.46	16
	එළවළු	2.65	5
	කෙසෙල්	8.57	12
කෑගල්ල	අන්නාසි	26.16	33
	කෙසෙල්	9.92	19
ගම්පහ	අන්නාසි	2.72	3
කුරුණෑගල	එළවළු	0.40	1
වව්නියාව	උඳු/කවුපි	1.21	2
මහනුවර	කෙසෙල්	2.65	6
රත්නපුර	අන්නාසි	29.66	21
	කෙසෙල්	6.36	11
	එළවළු හා කන්න භෝග	1.75	3
කොළඹ	අන්නාසි	32.03	32

	කෙසෙල්	1.56	2
	එළවළු හා කන්න භෝග	0.25	-
ගාල්ල	අන්නාසි	0.40	01
	කෙසෙල්	1.01	01
මාතර	කෙසෙල්	0.49	03
හම්බන්තොට	කෙසෙල්	0.81	01
	මුං ඇට	0.40	01
මොණරාගල	කෙසෙල්	19.06	19
	හේන් භෝග	22.67	34
	ගම්මිරිස්	0.40	01
	කොකෝවා	0.81	01
බදුල්ල	කෙසෙල්	1.21	01
	හේන් භෝග	4.66	08
එකතුව		191.27	237

වගු අංක XXIII

2020 වර්ෂයේ දී අතුරු භෝග වගා වැඩසටහන යටතේ හෙක්ටයාර් 191.27 ක අතුරු භෝග වගා කර ඇති අතර ඉලක්කගත බිම් ප්‍රමාණය හෙක්ටයාර් 300 කි. එනම් මෙම වසරේ අතුරු භෝග වගාව තුළින් 64% ක භෞතික ප්‍රගතියක් ළඟා කර ගැනීමට දෙපාර්තමේන්තුව සමත්ව ඇත. එමෙන්ම වගා කර ඇති භෝග අතරින් අන්නාසි වගාව සඳහා ගොවීන් ප්‍රමුඛතාවයක් ලබා දී ඇති අතර හෙක්. 104.43 ක අන්නාසි වගා කරමින් සමස්ත අතුරු භෝග වගාව සඳහා 55% ක දායකත්වයක් සපයා ඇත. අතුරු භෝග වගාව සඳහා වෙන් කරන ලද රු.මි 2.08 ක ප්‍රතිපාදනයෙන් රු.මි. 1.31 ක් වැය කරමින් 63% ක මූල්‍ය ප්‍රගතියක් අත් කර ගෙන ඇත.

2020 වර්ෂයේ රබර් ගොවීන් 237 දෙනෙකු අතුරු භෝග වගා කර ඇති අතර මේ සඳහා ඉහළ නැඹුරුතාවයක් පෙන්නුම් කරනුයේ මොනරාගල දිස්ත්‍රික්කය යි.

භෝග අනුව අතුරු භෝග වගා කළ බිම් ප්‍රමාණය – 2020 (හෙක්ටයාර්)



2.9. ස්වභාවික රබර් කර්මාන්තය ආශ්‍රිත තොරතුරු - 2020

2.9.1 රබර් වගා බිම් ප්‍රමාණය

2020 වර්ෂයේ දිවයිනෙහි ඇස්තමේන්තු ගත මුළු රබර් වගා බිම් ප්‍රමාණය 2010 වර්ෂයේ පවත්වන ලද රබර් ඉඩම් සංගණනයේ ප්‍රතිඵල පදනම් කර ගනිමින් ගණනය කර ඇත.

රබර් ඉඩම් ප්‍රමාණය (2010 – 2020)

වර්ෂය	ඇස්තමේන්තුගත බිම් ප්‍රමාණය (හෙක්.)		
	පෞද්ගලික අංශය (හෙක්ටයාර 20 ට අඩු ඉඩම්)	ප්‍රාදේශීය වැවිලි සමාගම් (හෙක්ටයාර 20 ට වැඩි ඉඩම්)	එකතුව
2010 (රබර් ඉඩම් සංගණනයෙන් වාර්තා වූ බිම් ප්‍රමාණය)	**79,395**	**46,250**	**125,645**
2011	**80,018**	**48,516**	**128,534**
2012	**82,170**	**48,610**	**130,780**
2013	**86,529**	**47,821**	**134,350**
2014	**87,735**	**47,975**	**135,710**
2015	**89,429**	**46,991**	**136,420**
2016	**87,862**	**48,278**	**136,140**
2017	**88,412**	**48,213**	**136,625**
2018	**89,243**	**47,863**	**137,106**
2019	**90,195**	**47,413**	**137,608**
2020	**89,592**	**48,242**	**137,834**

වගු අංක **XXIV**

පසුගිය වසර කිහිපය තුළ රබර් වගා බිම් ප්‍රමාණයේ ක්‍රමික වර්ධනයක් පෙන්නුම් කර ඇත. එයට හේතුව වන්නේ වාර්ෂිකව රබර් වගාවෙන් ඉවත්වන බිම් ප්‍රමාණයට වඩා රබර් නව වගා බිම් ප්‍රමාණයක් එකතුවීමයි. 2020 වර්ෂයට අදාළ ඇස්තමේන්තුගත බිම් ප්‍රමාණයෙන් 66% ක් කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ ඉඩම් කට්ටි වශයෙන් ද ඉතිරි 34% ක ප්‍රමාණය වැවිලි සමාගම් වතු වශයෙන් ද පවතී. මෙම මුළු බිම් ප්‍රමාණයෙන් අපරිනත බිම් ප්‍රමාණය හෙක්ටයාර් 17,305 ක් ද පරිනත බිම් ප්‍රමාණය හෙක්ටයාර් 120,529 ක් ලෙස ද ඇස්තමේන්තු කර ඇත. මෙම වසරේ රබර් හෙක්ටයාරයක සාමාන්‍ය වාර්ෂික අස්වැන්න වියළි රබර් කිලෝ ග්‍රෑම් 649 ක් ලෙස ගණනය කර ඇත.

2.9.2. රබර් නිෂ්පාදනය

2020 වර්ෂයේ දී මුළු රබර් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් **78,205** කි. **2019** වසරේ මුළු රබර් නිෂ්පාදනය වන මෙට්‍රික් ටොන් **74,753** ට සාපේක්ෂව **2020** වසරේදී රබර් නිෂ්පාදනය **4%** ක වර්ධනයක් පෙන්නුම් කර ඇත. පෙර වර්ෂයන්හි දී පහළ අගයක් ගත් රබර් මිල **2020** වර්ෂයේ ඉහළ යාම රබර් නිෂ්පාදනයේ වර්ධනයට බලපෑ ප්‍රධානතම සාධකය වේ.

ස්වාභාවික රබර් නිෂ්පාදනය (මෙට්‍රික් ටොන්) 2012 – 2020

වර්ෂය	ස්වාභාවික රබර් නිෂ්පාදනය (මෙට්‍රික් ටොන්)
2012	152,050
2013	130,421
2014	98,573
2015	88,567
2016	79,100
2017	83,070
2018	**82,560**
2019	**74,753**
2020	**78,205**

වගු අංක **XXV**

වර්ෂ කිහිපයක් තුළ මුළු රබර් නිෂ්පාදනයෙහි ඇති වූ වෙනස් වීම් පහත ප්‍රස්තාරය මගින් වැඩි දුරටත් පෙන්වා දී ඇත.

ප්‍රස්තාර අංක **viii** රබර් නිෂ්පාදනය - **2020**



ඉහත ප්‍රස්තාරයට අනුව පෙර වසරට සාපේක්ෂව 2020 වසරේ රබර් නිෂ්පාදනයේ ඉහළ යාමක් සිදුව ඇති නමුත් 2012 වසරේ සිට 2019 දක්වා රබර් නිෂ්පාදනය අඩු වී ඇත. මේ සඳහා රබර් මිල පහළයාම ප්‍රධාන වශයෙන් බලපා ඇත.

ලෝක රබර් නිෂ්පාදනය - 2020 (මෙට්‍රික් ටොන් දහස්)

රට	රබර් නිෂ්පාදනය 2019	රබර් නිෂ්පාදනය 2020
තායිලන්තය	4,852.00	4,335.20
ඉන්දුනීසියාව	3,301.00	2,884.60
වියට්නාමය	1,173.00	1,235.00
චීනය	812.00	692.70
අයිවරි කෝස්ට්	700.00	855.00
ඉන්දියාව	702.00	679.00
මැලේසියාව	650.00	510.00
කාම්භෝජය	288.00	349.30
මියන්මාරය	305.00	263.30
බ්‍රසීලය	185.00	192.00
ලාඕසය	130.00	129.20
පිලිපීනය	115.00	103.60
ගෝතමාලා	102.00	104.80
ශ්‍රී ලංකාව	75.00	78.20
අනෙකුත් රටවල්	25.00	373.30
ලෝක නිෂ්පාදනය	13,415.00	15,785.00

වගු අංක XXVI

2.9.3. රබර් නිෂ්පාදන වියදම

රබර් නිෂ්පාදන වියදම 2007 – 2020 (කි.ග්‍රෑම් 1 ක් /රුපියල්)

වර්ෂය	වැවිලි සමාගම්	කුඩා වතු අංශය
2007	102.31	112.69
2008	119.89	114.00
2009	135.83	118.56
2010	158.94	119.83
2011	188.23	129.56
2012	207.00	136.00
2013	245.00	150.00
2014	280.00	160.00
2015	285.00	170.00
2016	286.41	180.00
2017	290.00	195.00
2018	300.00	205.00
2019	301.50	210.00
2020	349.55	213.50

වගු අංක XXVII

2020 වර්ෂයේ වියලි රබර් කිලෝ ග්‍රෑම් එකක් නිෂ්පාදනය සඳහා කුඩා වතු අංශයේ නිෂ්පාදන වියදමේ සාමාන්‍යය රු. 213.50 ක් වූ අතර පෙර වර්ෂයේ දී එම අගය රු. 210.00 කි. එසේම වැවිලි සමාගම් සඳහා නිෂ්පාදන වියදම රු. 349.55 ක් වූ අතර 2019 වර්ෂයේ නිෂ්පාදන වියදම රු. 301.50 කි. ඒ අනුව පෙර වසරට සාපේක්ෂව මෙම වසරේ නිෂ්පාදන වියදම කුඩා වතු අංශයේ රු. 3.50 කින් ද වතු අංශයේ රු. 48.05 කින් ද වැඩි වීමක් සිදුව ඇත. 2007 සිට 2020 වර්ෂය දක්වා වාර්ෂිකව නිෂ්පාදන වියදමෙහි වර්ධනයක් සිදු වී ඇති අතර ඒ සඳහා අස්වැන්න අඩු වීම, ශ්‍රමය සඳහා වැයවන මුදල වැඩිවීම හා යෙදවුම්වල මිල වැඩිවීම වැනි සාධක බලපා ඇත. නිෂ්පාදන වියදම 2007 වසරේ සිට වෙනස් වන ආකාරය පහත ප්‍රස්තාරය මඟින් පෙන්වා දී ඇත.

ප්‍රස්තාර අංක ix

රබර් නිෂ්පාදන වියදම 2007 – 2020 (කි.ග්‍රෑම් 1 ක් /රුපියල්)



2.9.4. දේශීය රබර් පරිභෝජනය – 2020

ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදිත ස්වභාවික රබර් අතීතයේ දී අපනයනය මත පදනම්ව පැවති ප්‍රමුඛ පෙලේ කාර්මික අමු ද්‍රව්‍යයක් ලෙස පැවති නමුත්, වර්තමානය වන විට එම තත්ත්වය අපනයනය පදනම් කරගත් භාණ්ඩ නිෂ්පාදනය සඳහා අමුද්‍රව්‍යක් ලෙසට නැඹුරුව ඇති අතර දේශීය නිමි භාණ්ඩ නිෂ්පාදනය සඳහා වැඩි වශයෙන් රබර් පරිභෝජනයක් පවතී. 2020 වර්ෂයේදීද ස්වභාවික රබර් මෙට්‍රික් ටොන් 112,080 ක රබර් පරිභෝජනයක් රට තුළ සිදුව ඇත. එනම් ආනයනය කරන ලද රබර් ද දේශීය පරිභෝජනය සඳහා යොදා ගෙන ඇත.

මාසය	දේශීය පරිභෝජනනය (මෙට්‍රික් ටොන්)
ජනවාරි	11,978
පෙබරවාරි	10,885
මාර්තු	11,785
අප්‍රේල්	5,900
මැයි	8,545
ජූනි	8,707
ජූලි	8,789
අගෝස්තු	8,662

සැප්තැම්බර්	10,550
ඔක්තෝබර්	9,702
නොවැම්බර්	7,998
දෙසැම්බර්	8,579
එකතුව	112,080

වගු අංක XXVIII

දේශීය රබර් පරිභෝජනය (2015 – 2020)

වර්ෂය	(මෙ.ටො.)
2015	127,564
2016	141,940
2017	128,142
2018	135,238
2019	112,556
2020	112,080

වගු අංක XXIX

2.9.5. රබර් අපනයනය

2019 සහ 2020 වර්ෂයේ අපනයනය කළ ස්වාභාවික රබර් ප්‍රමාණයන්

මාසය	අපනයනය කළ ප්‍රමාණය (මෙට්‍රික් ටොන්)	
	2019	2020
ජනවාරි	1,560	1,361
පෙබරවාරි	1,349	1,634
මාර්තු	1,978	725
අප්‍රේල්	1,507	705
මැයි	1,329	948
ජූනි	854	1,533
ජූලි	875	1,773
අගෝස්තු	788	846
සැප්තැම්බර්	737	1,130
ඔක්තෝබර්	604	1,271
නොවැම්බර්	568	1,671
දෙසැම්බර්	854	2,169
එකතුව	13,003	15,766

වගු අංක XXX

පෙර වර්ෂයට සාපේක්ෂව 2020 වර්ෂයේ ශ්‍රී ලංකාවේ අපනයනික ස්වාභාවික රබර් ප්‍රමාණයෙහි වර්ධනයක් සිදුව ඇත. දේශීය රබර් නිෂ්පාදනය ඉහළ යාම මේ සඳහා බලපා ඇති අතර රබර් මිල සැලකිය යුතු ලෙස වර්ධනය වීම නිසා ගොවීන් රබර් වගාව වෙත වැඩි වශයෙන් නැඹුරුවීම ද මේ සඳහා බලපා ඇත.

මුළු රබර් අපනයනය සහ අපනයන ආදායම - 2020

වර්ගය	අපනයනය කළ ප්‍රමාණය	අපනයන ආදායම (රු.මි.)
ස්වාභාවික රබර් (කි.ග්‍රෑම්)	15,765,886	5,579
කෘතිම රබර් (කි.ග්‍රෑම්)	5,492	1
අර්ධ නිමි රබර් (කි.ග්‍රෑම්)	5,134,000	531
නිමි භාණ්ඩ (කි.ග්‍රෑම්)	66,832,854	66,577
නිමි භාණ්ඩ (ඒකක)	30,193,777	78,392
සමස්ථ රබර් අපනයන ප්‍රමාණය (කි.ග්‍රෑම්)	87,738,232	72,688
සමස්ථ රබර් අපනයන ප්‍රමාණය (ඒකක)	30,193,777	78,392
එකතුව		151,080

වගු අංක XXXI

ශ්‍රී ලංකාවේ රබර් මිලදී ගත් ප්‍රධාන රටවල් 2020

රට	මිලදී ගත් ප්‍රමාණය (මෙ.ටො.)	%
පකිස්තානය	5,948	37.70
මැලේසියාව	2,481	15.70
ජපානය	1,294	8.20
ජර්මනිය	865	5.50
චීනය	714	4.50
ඉතාලිය	594	3.80
ඉන්දියාව	435	2.80
වියට්නාමය	434	2.80
ඇමරිකාව	425	2.70
දකුණු අප්‍රිකාව	366	2.30
අනෙකුත් රටවල්	2,210	14.00
එකතුව	15,766	100

වගු අංක XXXII

2.9.6. රබර් ආනයනය

ස්වාභාවික රබර් ආනයනය කළ ප්‍රමාණයන් - 2020

මාසය	ආනයන ප්‍රමාණය (මෙ.ටො.)	
	2019	2020
ජනවාරි	3,307	5,831
පෙබරවාරි	3,633	6,618
මාර්තු	2,734	7,109
අප්‍රේල්	2,623	1,878
මැයි	5,693	3,203
ජුනි	3,708	2,640
ජූලි	4,163	3,999
අගෝස්තු	4,950	4,583
සැප්තැම්බර්	4,184	4,176
ඔක්තෝබර්	5,778	3,714
නොවැම්බර්	5,422	2,049
දෙසැම්බර්	3,811	2,828
එකතුව	50,006	48,628

වගු අංක XXXIII

ශ්‍රී ලංකාව තුළ රබර් ආශ්‍රිත නිෂ්පාදන විශාල වශයෙන් සිදු කළ ද, ගොවියා ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් සීමා සහිතව රබර් ආනයනය කිරීමට සිදු වී තිබේ. 2019 වර්ෂයට සාපේක්ෂව 2020 වර්ෂයේ රබර් ආනයනය අඩු කර ගැනීමට හැකි වී ඇති අතර එය දේශීය ආර්ථිකය ශක්තිමත් කිරීමකි.

වාර්ෂිකව ස්වාභාවික රබර් ආනයනය කළ ප්‍රමාණය

වර්ෂය	ස්වාභාවික රබර් (මෙ.ටොන්)
2012	15,675.60
2013	11,155.80
2014	29,225.00
2015	54,376.60
2016	72,984.90
2017	61,801.20
2018	65,759.00
2019	50,006.30
2020	48,628.00

වගු අංක XXXIV

මුළු රබර් ආනයනය - 2020

වර්ගය	ආනයනය කළ ප්‍රමාණය	ආනයන වියදම (රු.මී.)
ස්වාභාවික රබර් (කි.ග්‍රෑම්)	48,627,866	12,263
කෘතිම රබර් (කි.ග්‍රෑම්)	65,676,387	19,309
අර්ධ නිමි රබර් (කි.ග්‍රෑම්)	31,901,821	4,711
නිමි භාණ්ඩ (කි.ග්‍රෑම්)	8,136,066	7,884
නිමි භාණ්ඩ (ඒකක)	3,470,246	8,064
සමස්ත රබර් ආනයන ප්‍රමාණය (කි.ග්‍රෑම්)	154,348,140	44,157
සමස්ත රබර් ආනයන ප්‍රමාණය (ඒකක)	3,470,246	8064
එකතුව		52,231

වගු අංක XXXV

රටවල් අනුව ස්වාභාවික රබර් ආනයනය කළ ප්‍රමාණයන්

රට	ආනයනය කළ ප්‍රමාණය (මෙ.ටො.)	%
තායිලන්තය	17,374	35.73
ඉන්දුනීසියාව	16,874	34.70
වියට්නාමය	11,089	22.80
අයිවරි කෝස්ට්	999	2.05
මියන්මාරය	733	1.51
මැලේසියාව	634	1.30
සිංගප්පූරුව	602	1.24
දකුණු කොරියාව	120	0.25
ගෝතමාලාව	101	0.21
කාම්භෝජය	80	0.16
අනෙකුත් රටවල්	22	0.05
එකතුව	48,628	100.00

වගු අංක XXXVI

2.9.7. රබර් මිල

කොළඹ රබර් වෙන්දේසියේ රබර් වර්ග අනුව වාර්ෂික සාමාන්‍ය මිල
(කිලෝ ග්‍රෑම් 1 ක් රුපියල්)

වර්ෂය	වාර්ෂික සාමාන්‍ය මිල		
	ෂීට් රබර් නො.1	ස්ක්‍රෑප් ක්‍රේප් නො.1.XBR	ලේටෙක්ස් ක්‍රේප් නො.1x
2019	**288.48**	**245.05**	**302.26**
2020	**350.04**	**255.31**	**357.89**

වගු අංක **XXXVII**

ගෝලීය දළ ජාතික නිෂ්පාදනයේ මන්දගාමී වර්ධනය හේතුවෙන් ස්වාභාවික රබර් සඳහා වන ඉල්ලුම අඩු වීම නිසා **2011** වසරේ සිට රබර් මිල අඩු වෙමින් පැවතුන ද **2019** වසරට සාපේක්ෂව **2020** වර්ෂයේ දී රබර් වල මිලෙහි වර්ධනයක් සිදුව ඇත.

කොළඹ රබර් වෙන්දේසියේ රබර්වල සාමාන්‍ය මිල ගණන් මාසිකව - 2020

මාසය	ෂීට් රබර් (ආර්.එස්.එස්)					ලේටෙක්ස් ක්‍රේප්					ස්ක්‍රෑප් ක්‍රේප්					
	1	2	3	4	5	1X	1	2	3	4	1XBR	2XBR	3XBR	No.4	F.B.	SKIM
ජනවාරි	326.46	319.00	315.00	280.00	272.00	351.43	348.67	336.33	321.89	264.38	255.71	256.60	254.88	249.00	253.00	247.25
පෙබරවාරි	301.25	ඉ.නැත	263.00	256.00	252.90	351.00	349.08	338.17	329.79	252.50	247.27	245.00	240.83	237.67	231.00	210.50
මාර්තු	300.00	288.00	273.00	ඉ.නැත	249.75	350.33	352.23	350.38	346.25	245.13	242.50	232.00	238.17	230.00	224.33	207.50
අප්‍රේල්	ඉ.නැත	ඉ.නැත	ඉ.නැත	ඉ.නැත	ඉ.නැත	330.67	333.00	301.50	275.75	211.13	201.00	200.00	190.50	ඉ.නැත	195.00	191.50
මැයි	ඉ. නැත	ඉ.නැත	ඉ.නැත	ඉ.නැත	ඉ.නැත	330.00	320.50	298.00	264.75	195.00	191.17	195.00	189.00	188.00	190.00	157.33
ජූනි	ඉ. නැත	ඉ.නැත	ඉ.නැත	ඉ.නැත	ඉ.නැත	300.00	297.00	271.00	252.63	199.00	193.50	191.33	192.50	189.80	181.00	184.13
ජූලි	ඉ.නැත	270.00	ඉ.නැත	245.00	255.00	288.67	294.80	281.40	273.50	225.50	218.60	203.50	210.75	207.00	193.00	193.13
අගෝස්තු	ඉ.නැත	292.50	278.00	270.00	264.00	332.00	331.13	311.50	295.50	271.63	259.75	251.67	233.67	227.50	210.00	231.25
සැප්.	323.00	ඉ.නැත	ඉ.නැත	ඉ.නැත	ඉ.නැත	355.00	354.50	341.00	327.00	299.00	291.00	253.25	234.38	230.00	215.00	252.00
ඔක්.	362.67	330.00	337.50	ඉ.නැත	ඉ.නැත	399.25	385.60	373.20	364.60	346.00	283.50	263.00	255.30	250.33	250.00	238.60
නොවැ.	406.88	417.00	375.00	302.50	ඉ.නැත	447.17	445.33	434.33	421.00	404.75	336.33	287.50	286.67	269.67	265.00	270.50
දෙසැම්බර්	430.00	ඉ.නැත	390.50	380.00	ඉ.නැත	459.13	455.50	447.75	441.25	387.60	343.33	324.70	310.50	294.00	292.50	274.13
සාමාන්‍ය	350.04	319.42	318.86	288.92	258.73	357.89	355.61	340.38	326.16	275.13	255.31	241.96	236.43	233.91	224.99	221.48

කොළඹ රබර් වෙන්දේසියේ රබර්වල සාමාන්‍ය මිල ගණන් 2010 - 2020																
වර්ෂය	ෂීට් රබර් (ආර්.එස්.එස්)					ලේටෙක්ස් ක්‍රෙප්					ස්ක්‍රෑප් ක්‍රේප්					
	1	2	3	4	5	1X	1	2	3	4	1XBR	2XBR	3XBR	No.4	F.B.	SKIM
2010	402.71	394.52	390.63	379.47	373.01	437.57	453.19	439.49	420.15	380.60	363.51	356.15	348.98	342.77	332.86	315.42
2011	513.05	504.56	492.45	486.12	470.92	575.65	566.93	542.02	502.89	471.71	461.83	452.71	442.25	441.54	428.49	413.67
2012	416.61	409.56	398.21	386.27	382.58	410.84	405.01	395.72	389.01	384.78	377.09	365.85	357.79	350.26	335.11	344.71
2013	376.78	369.00	360.70	337.30	341.79	397.33	389.89	372.01	353.67	320.67	309.04	296.78	281.84	271.85	262.07	253.64
2014	287.84	281.25	270.37	265.81	265.44	311.19	303.34	272.91	244.79	222.68	214.42	207.36	203.35	196.17	185.49	190.84
2015	252.16	248.02	247.60	233.93	236.52	276.65	270.01	249.81	231.00	195.94	181.63	170.66	164.98	157.30	143.08	114.62
2016	238.97	229.28	231.36	223.33	226.31	262.38	258.66	238.37	220.35	188.19	179.56	175.74	173.29	168.08	156.14	143.88
2017	337.27	330.48	324.50	309.57	295.79	351.64	348.01	336.32	322.53	280.39	269.51	262.71	256.41	250.20	230.62	221.44
2018	281.64	269.03	263.11	251.26	249.63	310.99	303.52	270.01	258.89	216.62	210.60	207.69	208.21	204.23	192.42	198.64
2019	288.48	282.83	272.43	269.69	253.46	302.26	297.65	282.80	274.16	253.27	245.05	239.71	236.14	231.72	220.48	220.13
2020	350.04	319.42	318.86	288.92	258.73	357.89	355.61	340.38	326.16	275.13	255.31	241.96	236.43	233.91	224.99	221.48

රබර් වෙළඳුන් විසින් ගොවීන්ගෙන් රබර් ලබාගත් මිලෙහි මාසික සාමාන්‍යයය (Farm Gate Price) 2020						
මාසය	ආර්.එස්.එස්					රබර් කිරි
	1	2	3	4	5	
ජනවාරි	289.35	286.43	279.37	273.62	270.91	273.33
පෙබරවාරි	277.56	274.08	267.94	261.64	258.10	255.00
මාර්තු	256.73	256.73	254.42	251.39	251.67	254.21
අප්‍රේල්	238.75	242.00	232.00	208.00	208.00	230.00
මැයි	229.35	227.71	221.46	214.65	214.65	213.50
ජූනි	245.44	241.53	236.64	228.72	229.66	218.44
ජූලි	253.46	249.10	244.88	237.74	235.96	219.03
අගෝස්තු	285.71	285.00	278.93	272.50	269.50	250.83
සැප්තැම්බර්	295.86	292.66	288.03	281.78	280.23	261.94
ඔක්තෝබර්	288.54	281.73	278.16	269.61	268.01	253.40
නොවැම්බර්	324.82	319.40	312.37	300.90	295.83	289.87
දෙසැම්බර්	373.04	360.40	358.88	343.95	343.69	317.35
සාමාන්‍ය අගය	279.88	276.40	271.09	262.04	260.52	253.08

වගු අංක XL

අන්තර්ජාතික රබර් මිල (2015 – 2020)

වර්ෂය	ශ්‍රී ලංකා රුපියල්			
	ශ්‍රී ලංකාව කොළඹ (RSS 3)	බැංකොක් තායිලන්තය (RSS 3)	කොච්චියාම් ඉන්දියාව (RSS 4)	සයිකොම් සිංගප්පූරුව (RSS 3)
2015	232.90	213.97	259.61	216.43
2016	231.36	250.45	271.85	211.77
2017	324.50	311.69	322.75	307.70
2018	263.11	257.00	301.80	256.01
2019	272.68	296.90	343.08	297.05
2020	318.86	327.01	339.82	322.17

වගු අංක XLI

2.9.8. බලපත්‍රලාභී රබර් වෙළඳුන් පිළිබඳ තොරතුරු

රබර් මිලදී ගැනීම සඳහා වෙළෙඳුන් විසින් බලපත්‍රයක් ලබා ගැනීම අනිවාර්ය වන අතර නෛතික අවශ්‍යතාවයන් අනුව බලපත්‍ර ලබා ගත් වෙළඳුන්ගේ බලපත්‍ර වාර්ෂිකව අලුත් කලයුතු වේ.2020 වසරේදී දිස්ත්‍රික්ක වශයෙන් රබර් වෙළඳුන් සඳහා බලපත්‍ර ලබා දුන් ආකාරය පහත වගුවේ දැක්වේ.

දිස්ත්‍රික්කය	අලුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව	නිකුත් කළ නව බලපත්‍ර සංඛ්‍යාව	එකතුව
කළුතර	171	07	178
කෑගල්ල	140	14	154
ගම්පහ	22	01	23
කුරුණෑගල	10	-	10
මහනුවර	09	02	11
මාතලේ	03	-	03
රත්නපුර	134	13	147
කොළඹ	43	-	43
ගාල්ල	24	02	26
මාතර	26	04	30
හම්බන්තොට	01	-	01
මොණරාගල	21	02	23
එකතුව	604	45	649

වගු අංක XLII

2020 වර්ෂයේ රබර් වෙළඳුන් විසින් බලපත්‍ර 604 ක් අලුත් කරන ලද අතර දෙපාර්තමේන්තුව මගින් නව බලපත්‍ර 45 ක් නිකුත් කර ඇත.

2.9.9. අන්තර් ජාතික කටයුතු

ශ්‍රී ලංකාව ජාත්‍යන්තර රබර් අධ්‍යයන කණ්ඩායමේ (International Rubber Study Group - (IRSG)) හා ස්වභාවික රබර් නිපදවන රටවල සංගමයේ (Association of Natural Rubber Producing Countries - (ANRPC)) සාමාජිකත්වය දරයි.
මෙම ආයතනවල සාමාජිකත්වය දැරීමෙන් එකී ආයතනවල ක්‍රියාකාරකම්වලට සෘජුව හා ක්‍රියාශීලීව දායක වීම තුළින් අන්‍යෝන්‍ය වශයෙන් රබර් කර්මාන්තයේ උන්නතියට වාසි සහගත තත්ත්වයක් උදා කරගත හැකිවේ. තවද, එකී ආයතනවලට දේශීය රබර් මිල, නිෂ්පාදන හා අලෙවි තොරතුරු, වගා බිම් ප්‍රමාණ, ක්ෂේත්‍රයේ නියැලි සංඛ්‍යාවන් ඇතුළු අවශ්‍ය සියලු තොරතුරු අවශ්‍ය අවස්ථාවල දී වාර්තා කරනු ලැබේ. එසේම එම ආයතන මගින් සෙසු රටවල තොරතුරු ද ලබා ගෙන අදාළ පාර්ශවයන් අතර බෙදාහරිනු ලැබේ.

2020 වසරේ ස්වභාවික රබර් නිපදවන රටවල සංගමයේ (ANRPC) වාර්ෂික සමුළුවක් පැවැත්වීමට කොවිඩ් තත්ත්වය හමුවේ නොහැකි වී ඇත. එසේ වුවද වරින් වර සාමාජික රටවල් අතර නවීන තාක්ෂණය ඔස්සේ සම්බන්ධීකරණ කටයුතු සිදු කෙරිණි.

2.9.10 ඒකාබද්ධ අරමුදල

වියදම් විෂය		වෙන්කළ ප්‍රතිපාදනය (රු.)	2020.12.31 දිනට ශුද්ධ වියදම (රු.)
පුනරාවර්තන වියදම්			
වැටුප් හා වේතන	1001	190,000,000.00	183,664,358.94
අතිකාල හා නිවාඩු දින වැටුප්	1002	6,300,000.00	6,081,753.70
වෙනත් දීමනා	1003	72,000,000.00	67,740,332.64
ගමන් වියදම් - දේශීය	1101	11,100,000.00	11,032,724.11
ගමන් වියදම් - විදේශීය	1102	1,000,000.00	0.00
ලිපි ද්‍රව්‍ය හා කාර්යාලයීය අවශ්‍යතා	1201	4,100,000.00	3,888,475.26
ඉන්ධන	1202	6,000,000.00	5,880,175.47
ආහාර පාන සහ නිල ඇඳුම්	1203	500,000.00	424,407.06
වෙනත්	1205	500,000.00	303,704.25
වාහන නඩත්තු	1301	5,000,000.00	4,994,422.26
යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ නඩත්තු	1302	500,000.00	430,203.20
ගොඩනැගිලි සහ ඉදිකිරීම් නඩත්තු	1303	300,000.00	294,028.20
තැපැල් සහ සන්නිවේදන	1402	6,000,000.00	4,321,855.65
විදුලිය සහ ජලය	1403	2,000,000.00	1,579,897.88
බදු කුලී සහ පළාත් පාලන ආයතන බදු	1404	44,100,000.00	42,082,907.99
මෙහෙයුම් කල්බදු වාහන සඳහා වාරික ගෙවීම්	1408	10,000,000.00	9,845,200.00
වෙනත්	1409	10,400,000.00	9,819,790.52
සම්මාදම් සහ දායක මුදල්	1505	8,000,000.00	1,182,308.64
රජයේ සේවකයන් සඳහා දේපළ ණය පොලී	1506	2,000,000.00	1,862,144.65
මූලධන වියදම්			
ගොඩනැගිලි සහ ඉදිකිරීම්	2001	7,200,000.00	7,181,196.90
යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	2002	500,000.00	499,522.08
වාහන	2003	3,400,000.00	3,394,309.33
ගෘහ භාණ්ඩ සහ කාර්යාලයීය උපකරණ	2102	1,500,000.00	1,496,120.50
යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	2103	500,000.00	499,924.00

ගොඩනැගිලි සහ ඉදිකිරීම්	2104	0.00	0.00
මෘදුකාංග සංවර්ධනය	2106	800,000.00	789,006,00
කාර්ය මණ්ඩල පුහුණු	2401	1,300,000.00	1,222,705.00
සංවර්ධන සහායන්	2202	1,000,000,000.00	823,010,127.49
පර්යේෂණ සහ සංවර්ධන	2507	15,000,000.00	9,410,706.35
එකතුව (සම්පූර්ණ)		1,410,000,000.00	1,202,932,308.07

වගු අංක XLIII

2.9.11 සෙස් බදු ලැබීම් සහ අය කිරීම්.

රබර් ආශ්‍රිත නිමි භාණ්ඩ නිෂ්පාදනය කරන කර්මාන්ත කරුවන්ගෙන් එම භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා දේශීය වශයෙන් මිල දී ගන්නා ස්වාභාවික රබර් සඳහා සෙස් බදු අය කරනු ලැබේ.

2007 අංක **01** දරණ සෙස් බදු නියෝගවලට අනුව මිල දී ගනු ලබන අමු රබර් කි.ග්‍රෑ **1** ක් සඳහා රු. **4/-** බැගින් සෙස් බද්දක් ගෙවිය යුතුය. එම බදු මුදල් "අධ්‍යක්ෂ ජනරාල්, රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව" නමට ලියන ලද චෙක්පතක් මගින් යොමු කළ යුතුය.

සෙස් බදු සඳහා ලියාපදිංචි ආයතන විස්තරය - **2020**

2020 වර්ෂය සඳහා ලියාපදිංචි ආයතන සංඛ්‍යාව	-	**146**
සෙස් බදු ගෙවනු ලබන ආයතන සංඛ්‍යාව	-	**58**
සෙස් ගෙවන සමාගම් සංඛ්‍යාව	-	**58**
සෙස් බදු නොගෙවූ ආයතන සංඛ්‍යාව	-	**88**
සෙස් බදු සඳහා ලියාපදිංචි අපනයනකරුවන් සංඛ්‍යාව	-	**109**

දේශීය පරිභෝජනය අනුව අය කළ සෙස් බදු ප්‍රමාණය මාසිකව – **2020**

මාසය	දේශීය පරිභෝජනය අනුව අය කළ සෙස් බදු ප්‍රමාණය (රු.මි)
ජනවාරි	**18.85**
පෙබරවාරි	**9.21**
මාර්තු	**0**
අප්‍රේල්	**14.09**
මැයි	**13.29**
ජූනි	**24.09**
ජූලි	**33.54**
අගෝස්තු	**17.52**

සැප්තැම්බර්	20.10
ඔක්තෝබර්	11.76
නොවැම්බර්	14.40
දෙසැම්බර්	26.98
එකතුව	203.83

වගු අංක XLIV

රබර් ආනයනය හා අපනයනය මත අය කරන ලද සෙස් බදු මුදල් පිළිබඳ විස්තර මෙසේය.

අපනයනය හා ආනයනය මත අය කළ සෙස් බදු ප්‍රමාණය මාසිකව – 2020

මාසය	ආනයනය මත අය කළ සෙස් බදු ප්‍රමාණය (රු.මි)	අපනයනය මත අය කළ සෙස් බදු ප්‍රමාණය (රු.මි)
ජනවාරි	188.52	5.09
පෙබරවාරි	185.65	6.89
මාර්තු	80.26	2.85
අප්‍රේල්	172.44	3.44
මැයි	87.73	4.16
ජුනි	64.19	5.87
ජූලි	50.85	6.95
අගෝස්තු	68.60	28.89
සැප්තැම්බර්	73.77	4.57
ඔක්තෝබර්	159.69	5.34
නොවැම්බර්	157.32	7.17
දෙසැම්බර්	309.08	8.50
එකතුව	1598.10	89.72

වගු අංක XLV

2015 සිට 2020 දක්වා මුළු සෙස් බදු අය කිරීම් පිළිබඳ විස්තර

වසර	බදු අය කිරීම (රු.)
2015	169,315,461.01
2016	169,826,685.48
2017	216,985,124.32
2018	211,268,567.06
2019	226,827,187.71
2020	203,821,239.13

වගු අංක XLVI

3. පරිච්ඡේදය - 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ කාල සීමාව සඳහා සමස්ත මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

රු.

	අයවැය 2020	සටහන	තත්‍ය 2020	තත්‍ය 2019	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	ඒසීඒ -1
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	
-	ජාත්‍යන්තර වෙළඳාම් මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		861,071,000.00	640,019,000.00	ඒසීඒ -3
-	තැන්පතු		30,534,784.00	40,701,499.00	ඒසීඒ -4 ඒසීඒ
-	අත්තිකාරම් ගිණුම්		16,826,392.00	23,350,460.00	5/5(අ)
-	වෙනත් ලැබීම්		346,962,149.00	336,654,115.00	
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		**1,255,394,325.00**	**1,040,725,074.00**	
-	මුළු ආදායම් ලැබීම් හා ආදායම් නොවන				
	ලැබීම් ඇ = (අ) + (ආ)		**1,255,394,325.00**	**1,040,725,074.00**	
	අඩු කලා- වියදම්				
	පුනරාවර්ථන වියදම්		-		
224500000	වැටුප්, වෙනත් හා අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	257,486,445.00	252,395,606.00	ඒසීඒ 2(ii)
93000000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	94,897,792.00	102,248,674.00	
10500000	සහනාධාර, ප්‍රදාන හා මාරු කිරීම්	7	3,044,453.00	10,797,410.00	
	පොළී ගෙවීම්	8	-	-	
	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
328000000	මුළු පුනරාවර්තන වියදම්(ඈ)		**355,428,690.00**	**365,441,690.00**	

	මූලධන වියදම්				
	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා				
19500000	වැඩිදියුණු කිරීම්	10	11,075,028.00	16,876,805.00	
9700000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම	11	2,785,051.00	3,490,748.00	
800000000	ප්‍රාග්ධන මාරු කිරීම්	12	823,010,127.00	564,063,205.00	ඒසිඒ-2(ii)
	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	
1800000	හැකියා වර්ධනය	14	1,222,705.00	1,390,714.00	
15000000	වෙනත් මූලධන වියදම්	15	9,410,706.00	8,206,165.00	
846000000	**මුළු මූලධන වියදම් (ඉ)**		**847,503,618.00**	**594,027,637.00**	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)		52,407,791.00	-	
	තැන්පතු ගෙවීම්		32,424,911.00	55,786,353.00	ඒසිඒ -4 ඒසිඒ -5
	අත්තිකාරම් ගෙවීම්		19,982,880.00	25,220,425.00	
	මුළු වියදම් උ = (ඇ+ඉ+ඊ)		1,255,340,099.00	1,040,476,106.00	
	2019 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	
1174000000	උ = (ඇ-උ)		**54,226.00**	**248,968.00**	

වගු අංක **XLVII**

3.2. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු.

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	380,000,000	379,800,000	355,428,690.42	93.58%
ප්‍රාග්ධන	1,030,000,000	1,030,200,000	847,503,617.65	82.27%

වගු අංක **XLVIII**

3.3. පරිත්‍යාග සහ වෙනත් ලැබීම් පිළිබඳ කාර්ය සාධනය අදාළ නොවේ.

3.4 . මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු.

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2020 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2020 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්		181,929,111.60		
9152	යන්ත්‍රෝපකරණ	223,361,566.60	178,302,366.80	45,059,199.80	100%
9153	ඉඩම්		408,370,800.00		
9154	අස්පෘශ්‍ය වත්කම්				
9155	ජීව විද්‍යාත්මක වත්කම්				
9160	දැනට ක්‍රියාත්මක කරමින් පවතින වැඩ				
9180	බදු දෙන ලද වත්කම්				

වගු අංක **XLIX**

3.5. විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. PLA/C/RDD/02/20/03 මබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 07 2021 අගෝස්තු දින

ගණන්දීමේ නිලධාරී
රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව

රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 **තත්ත්වාගණනය නොකළ මතය**

රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම,මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම

මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඡේද යොමුව	විගණන නිරීක්ෂණය	නිර්දේශය
1.6.4	**ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**	
	දෙපාර්තමේන්තුව විසින් මු. රෙ. 891 (i) පරිදි සේවක ඇප තැන්පතු ලේඛනය පවත්වා නොතිබුණු අතර, මු.රෙ.110 පරිදි පාඩු හා හානි ලේඛණයක් විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	මුදල් රෙගුලාසිවල සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් සහ පාඩු සහ හානි ලේඛනයක් පවත්වා ගත යුතුය.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

1.6.1.1 ආදායම් නොවන ලැබීම්

ශේෂ පිරික්සුම අනුව වර්ෂය තුළ වෙනත් ලැබීම් රු.346,625,662 ක් වුවද, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව එම ලැබීම් රු.346,962,149 ක් වූයෙන් රු.336,487 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.6.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණි.

ලේඛන වර්ගය	අදාළ රෙගුලාසිය	නිරීක්ෂණය
ඇප තැන්පත් ලේඛනය	මු. රෙ. 891 (i)	පවත්වාගෙන නොතිබුණි.
හානි පාඩු ලේඛනය	මු. රෙ. 110	පවත්වාගෙන නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

(අ) පුනරාවර්තන වැය විෂයයන් 03 ට අදාළ රු.14,500,000 ක් වූ ශුද්ධ ප්‍රතිපාදන මුදලින් සමාලෝචිත වර්ෂය තුළදී රු.8,692,131 ක මුදලක් එනම් ශුද්ධ ප්‍රතිපාදිත මුදලින් සියයට 85 ත් සියයට 28 ත් අතර ප්‍රතිශතයක් උපයෝජනය කර නොතිබුණි.

(ආ) 293-2-1-2507 (පර්යේෂණ සහ සංවර්ධන) ප්‍රාග්ධන වැය විෂය සඳහා වෙන් කරන ලද රු.15,000,000 ක ප්‍රතිපාදිත මුදලින් සමාලෝචිත වර්ෂය තුළදී රු.5,589,294 ක මුදලක් උපයෝජනය කර නොතිබූ අතර, එය ප්‍රතිපාදන මුදලින් සියයට 37 ක ප්‍රතිශතයක් වී තිබුණි.

2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල ගෙවීම

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය xix පරිච්ඡේදය 6.2 වගන්තිය	නිල නිවාසවල පදිංචිව සිටින නිලධාරීන් විශ්‍රාම යාමේදී එම නිල නිවාසවලින් ඉවත්ව යා යුතු වුවද, රත්නපුර සහ කළුතර දිස්ත්‍රික්කවල නිල නිවාස දෙකක පදිංචි සිටි රබර් සංවර්ධන නිලධාරීන් දෙදෙනෙකු පිළිවෙලින් 2017 ජූනි සහ 2015 දෙසැම්බර් 13 දින සිට විශ්‍රාම ගොස් සිටි නමුත් සමාලෝචිත වර්ෂය වන විටත් එම නිල නිවාස වලින් ඉවත් වී ආපසු බාරදීමට කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1. කාර්ය භාරයයන් ඉටු නොකිරීම

රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් දිවයිනේ රබර් වගා කර ඇති මුළු ඉඩම් ප්‍රමාණය පිළිබඳව සංඛ්‍යා ලේඛනයන් පවත්වා ගත යුතු වන අතර සමාලෝචිත වර්ෂයේ ඒ සඳහා රු.5,000,000 ක් ප්‍රතිපාදනය කර තිබුණ ද එම කාර්යය ඉටුකර නොතිබුණි.

3.2 අපේක්ෂිත නිමැවුම් මට්ටම් ලබා නොගැනීම

(අ) සමාලෝචිත වර්ෂයේදී කුඩා රබර් වතු හිමියන්ගේ හා වැවිලි සමාගම්වල පිළිවෙලින් ඉඩම් හෙක්ටයාර 512 ක හා 820 ක රබර් නැවත වගා කිරීමට අපේක්ෂා කර තිබුණ ද ඉන් නැවත වගාකර තිබුණේ ඉඩම් හෙක්ටයාර් 456 ක් හා හෙක්ටයාර් 499 ක් පමණි. ඒ අනුව ඉටු නොකළ ප්‍රමාණය පිළිවෙලින් සැලසුම් කළ ප්‍රමාණයෙන් සියයට 10 ක් හා සියයට 40 ක් වී තිබුණි.

(ආ) දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේ සහනාධාර යටතේ දිස්ත්‍රික්ක 15 ක ඉඩම් හෙක්ටයාර 260 ක් නව වගා කිරීමට සැලසුම් කර තිබුණද ඉඩම් හෙක්ටයාර් 190 ක් පමණක් වගා කිරීම සිදුකර තිබුණි. ඒ අනුව ඉටු නොකළ ප්‍රමාණය සැලසුම් කල ප්‍රමාණයෙන් සියයට 26 ක් වී තිබුණි.

(ඇ) කුඩා වතු අංශය විසින් රබර් නැවත වගා සහනාධාර ක්‍රමය යටතේ නැවත වගාවන් සඳහා ඉඩම් හෙක්ටයාර් 771 කට වගාකරුවන් 966 දෙනෙකු වෙත බලපත්‍ර නිකුත් කර තිබුණු නමුත් ඉඩම් හෙක්ටයාර 456 ක බලපත්‍ර ලාභීන් 640 දෙනෙකු පමණක් නැවත වගාව සිදුකර තිබුණි. ඒ අනුව බලපත්‍ර නිකුත් කළ ප්‍රමාණයෙන් සියයට 33 ක් වගාව සිදු කර නොතිබුණි.

3.3 රජයේ නිලධාරීන් ඇප තැබීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු. රෙ. 880 (i) පරිදි රජයේ මුදල්, ආදායම් මුද්දර හෝ බඩු බාහිරාදිය භාර ගැනීම හෝ භාරව සිටීම, එසේ නැතහොත් රජයේ මුදල් බෙදා හැරීම හෝ මුද්දර නැතහොත් බඩු බාහිරාදිය නිකුත් කිරීම, සම්බන්ධයෙන් පරිපාලනමය වශයෙන් වගකිව යුතු හෝ බලය පැවරීම යටතේ එම කටයුතු පවරනු ලැබ ඇති හෝ නිලධාරීන්ද, රජයේ ගිණුමට අදාළ වවුචර සහතික කරන චෙක්පත් අත්සන් කරන අයද ස්වකීය රාජකාරී කටයුතු අවංකව ඉටු කරන බවට 612 වන අධිකාරිය වන රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතට අනුකූලව ඇප තැබිය යුතු වුවද, මෙම දෙපාර්තමේන්තුවේ මු. රෙ. 880 (i) යටතේ දක්වා ඇති කාණ්ඩවලට අයත් නිලධාරීන්

සංඛ්‍යාව හඳුනාගෙන ඇප තැන්පත් කිරීමට කටයුතු කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ 2019 නොවැම්බර් 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ 07/2019 කෙරෙහිද අවධානය යොමු කළ යුතු බව නිරීක්ෂණය කෙරේ.

3.4 පාඩු හා හානි

දෙපාර්තමේන්තුව සතු වාහන 08 කට අදාළව සිදුව තිබූ අනතුරු හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අලාභ මුළු වටිනාකම රු.2,466,640 ක් වූ අතර මෙම අලාභයන් මෙතෙක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.5 අනාර්ථික ගණුදෙනු

රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවට ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා 2009 වර්ෂයේ දී පර්චස් 75 ක රු.66,700,000 ක් වටිනා ඉඩමක් මිල දී ගැනීමට නාගරික සංවර්ධන අධිකාරිය වෙත රු.59,304,347 ක් ගෙවා තිබුණි. එසේම එම ඉඩමේ ගොඩනැගිල්ල ඉදිකිරීමට සහ සැලසුම සකස් කිරීමට ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට රු.150,000 ක් 2009 වර්ෂයේදී ගෙවීම් කර රු.මිලියන 249 ක ඇස්තමේන්තුවක්ද සකස් කර ගෙන තිබුණි. මෙම මූලික කටයුතු අවසන් කර වර්ෂ 11 ක් පමණ ගත වී ඇතත් හිඟ මුදල ගෙවා දෙපාර්තමේන්තුව වෙත ඉඩම පවරා ගැනීමේ කටයුතු සහ ඉඩමේ ඉදිකිරීම් කටයුතු මෙතෙක් සිදු කර නොතිබුණු අතර 2017 පෙබරවාරි මාසයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම දෙපාර්තමේන්තුව කුලියට ගත් පෞද්ගලික ගොඩනැගිල්ලක පවත්වාගෙන යමින් තිබුණි.

3.6 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) රබර් නැවත වගාව සහ නව වගාව සහනාධාර ක්‍රමය යටතේ දිස්ත්‍රික්ක 9 ක රබර් වගා සහනාධාර ලබාදුන් වගාකරුවන් 9398 දෙනෙකුගෙන් වගාකරුවන් 603 දෙනෙකු වගාව අත්හැර දැමීම නිසා රු.21,702,451 ක් දෙපාර්තමේන්තුවට අය වීමට තිබුණි.

(ආ) දෙපාර්තමේන්තුවට අයත් නිල නිවාස 77 න් නිල නිවාස 11 ක් අලුත්වැඩියා කළ යුතු මට්ටමේ පැවති අතර, එම නිවාස වර්ෂ 13 ක කාලයක් අභාවිතව පැවතුණි. එසේම නිල නිවාස 23 ක් නිලධාරීන්ට ලබා නොදී කාර්යාල ලෙස පවත්වා තිබුණි.

4. මානව සම්පත් කළමනාකරණය

සමාලෝචිත වර්ෂයේ අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත පරිදි වේ.

සේවා වර්ගය	අනුමත සේවක සංඛ්‍යාව	තත්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ මට්ටම	37	27	10
තෘතියික මට්ටම	21	10	11
ද්විතියික මට්ටම	336	279	57
ප්‍රාථමික මට්ටම	84	66	18
	478	382	96

(අ) 2020 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 478 ක් වූ අතර ඉන් තනතුරු 96 ක් පුරප්පාඩු පැවතිණි. එම පුරප්පාඩු අතුරින් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ අධ්‍යක්ෂ තනතුරු 5 ක් ද ගණකාධිකාරී තනතුරු 02 ක් ද පුරප්පාඩු වී තිබීම හේතුවෙන් දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂමතාවය වර්ධනය කර ගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් ක්‍රියාවලියට ඍජුවම දායක වන ජ්‍යෙෂ්ඨ රබර් සංවර්ධන නිලධාරීන් 10 ක් ද රබර් සංවර්ධන නිලධාරීන් 50 ක් ද පුරප්පාඩු පැවතීම ව්‍යාපෘති කටයුතුවල ඉලක්ක ලභා කර ගැනීම දුෂ්කරවීමට බලපාන සාධකයක් වී තිබුණි.

ආර්.එම්.රත්නායක
සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

3.6. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-සි

2020 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	කනය 2020 රු.	2019 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	816,422,674	768,602,278
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	49,929,667	46,773,178
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	-	820,769
මුළු වත්කම්		**866,352,341**	**816,196,225**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
ශුද්ධ වත්කම්		43,461,930	38,415,314
දේපළ පිරියත හා උපකරණ සංචිතය		816,422,674	768,602,278
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසිඒ-5(බී)		
ප්‍රංගම වගකීම්			
නැන්පතු ගිණුම්	ඒසිඒ-4	6,467,737	8,357,864
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	-	820,769
මුළු වගකීම්		**866,352,341**	**816,196,225**

පිටු අංක 01 සිට 17 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 18 සිට 27 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විශ්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මඟින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
නම :	නම :	අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
තනතුර :	තනතුර :	නම :
දිනය :	දිනය : 25/02/2021	දිනය : 2021.02.25

රවින්ද්‍ර හේවාවිතාරණ
ලේකම්
වැවිලි අමාත්‍යාංශය
11 වන මහල,
සෙත්සිරිපාය II වන අදියර,
බත්තරමුල්ල.

ඩබ්.එච්.එස්.ආර්. ජොන්සේකා
ප්‍රධාන ගණකාධිකාරී
රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව
අංක. 465, ගනහේන,
බත්තරමුල්ල.

2

3.7. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-සී

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

	තත්‍ය	
	2020 රු.	2019 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු ,අධිභාර, දඩ මුදල් හා බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	346,962,149	334,964,247
වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	-	0
අග්‍රිම ලැබීම්	861,071,000	640,019,000
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් (අ)	1,208,033,149	974,983,247
අඩුකළා : මුදල් වැයකිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	352,384,237	354,644,280
සහනාධාර සහ මාරු කිරීම් වියදම්	3,044,453	10,797,410
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරණ ලද වියදම්	2,765,690	1,689,299
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	-	0
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහයන් (ආ)	358,194,380	367,130,989
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් (ඇ)=(අ)-(ආ)	849,838,769	607,852,258
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	1,689,868
ලාභාංශ	-	0
භිමිකම් ඉවත් වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	0
උපණය අයකර ගැනීම	-	0
අත්තිකාරම් අයකර ගැනීම්	13,184,197	17,851,225
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් (ඇ)	13,184,197	19,541,093

අඩුකළා - මුදල් වැයකිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	846,195,223	591,860,552
අත්තිකාරම් ගෙවීම්	14,937,617	19,627,176
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	861,132,840	611,487,728
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහයන්(ඊ)=(ඇ)-(ඉ)	(847,948,643)	(591,946,635)
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ)+(ඊ)	1,890,126	15,905,623
<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
දේශීය ණය ගැනීම්	-	0
විදේශීය ණය ගැනීම්	-	0
ප්‍රදානයන් ලැබීම්	-	0
තැන්පත් ලැබීම්	30,534,784	40,701,499
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් (ඌ)	30,534,784	40,701,499
<u>අඩුකළා - මුදල් වැයකිරීම්</u>		
දේශීය ණය ආපසු ගෙවීම්	-	0
විදේශීය ණය ආපසු ගෙවීම්	-	0
තැන්පතු ගෙවීම්	32,424,911	55,786,353
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	32,424,911	55,786,353
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	(1,890,126)	15,084,854
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ)=(උ)-(ඒ)	(0)	820,769
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	0
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	0

වගු අංක L

4. පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක

4.1. ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	ඉලක්කය	ප්‍රගතිය	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම
1. නැවත වගා කළ බිම් ප්‍රමාණය - කුඩාවතු (හෙක්.)	**520**	**457**	**88%**
2. නැවත වගා කළ බිම් ප්‍රමාණය - වැවිලි සමාගම් (හෙක්.)	**820**	**519**	**63%**
3. නව වගා කළ බිම් ප්‍රමාණය (හෙක්.)	**260**	**197**	**76%**
4. රබර් පැළ නිෂ්පාදනය - දෙපාර්තමේන්තු පැළ තවාන්වල (පැළ)	**1 300 000**	**1 026 899**	**79%**
5. වැහි ආවරණ යෙදූ ඉඩම් ප්‍රමාණය - කුඩා වතු (හෙක්.)	**2700**	**941**	**35%**
6. වැහි ආවරණ යෙදූ ඉඩම් ප්‍රමාණය - වැවිලි සමාගම් (හෙක්.)	**5 000**	**5 945**	**118%**
7. රබර් කිරි කැපීම පුහුණුව ලැබූ සංඛ්‍යාව (සාමාන්‍ය) - (පුද්ගලයන්)	**2 920**	**2311**	**79%**
8. බද්ධ පුහුණුව ලැබූ සංඛ්‍යාව (පුද්ගලයන්)	**210**	**211**	**100%**
9. රබර් කිරි කැපීම පුහුණුව (වෘත්තීය) (පුද්ගලයන්)	**300**	**212**	**71%**

වගු අංක **LI**

5. පරිච්ඡේදය - තිරසාර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1 . හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු

ඉලක්කය / අරමුණ	ඉලක්ක	ප්‍රගතිය	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය
විශේෂයෙන්ම දරිද්‍රතාවයෙන් පෙළෙන සහ අවදානමට ලක්විය හැකි අය ඇතුළුව සියලුම පිරිමින්ට සහ කාන්තාවන්ට 2030 වසර වන විට ආර්ථික සම්පත්, මූලික සේවාවන්, ඉඩම් හිමිකාරිත්වය හා පාලනය කිරීම සහ වෙනත් ආකාරයේ දේපළ උරුමයන්, ස්වභාවික සම්පත්, සුදුසු නව තාක්ෂණය සහ ක්ෂුද්‍ර මූල්‍ය ඇතුළුව මූල්‍ය සේවාවන් සඳහා ප්‍රවේශ වීමට සමාන අයිතිවාසිකම් තහවුරු කිරීම.	1. නව වගාව - කුඩා වතු සඳහා හෙක්. 260 2. නැවත වගාව - කුඩා වතු සඳහා හෙක්. 520	197 457	හෙක්. හෙක්.	76% 88%
2030 වන විට තිරසර ආහාර නිෂ්පාදන පද්ධති පැවැතීම තහවුරු කිරීම සහ ජෛව පද්ධති පවත්වා ගැනීමට උපකාරී වන්නා වූ, කාලගුණ වෙනස්වීම්වලට හැඩගැසීම සඳහා වූ ධාරිතාවන් ශක්තිමත් කරන්නා වූ හානිකර කාලගුණ තත්වයන්, නියඟ, ගංවතුර සහ වෙනත් ආපදාවන් සහ ඉඩම් සහ පසේ ගුණාත්මක තත්ත්වයන් වර්ධනය කරන්නා වූ ඔරොත්තු දිය හැකි කෘෂිකාර්මික භාවිතාවන් ක්‍රියාවට නැංවීම.	1. වැහි ආවරණ යෙදීම කුඩා වතු - හෙක්. 2,700 2. වැහි ආවරණ යෙදීම වැවිලි සමාගම් - හෙක් 5,000 3. අතුරු බෝග වගා කිරීම හෙක්. 300	941 5,945 191	හෙක්. හෙක්. හෙක්.	35% 118% 64%
2020 වන විට බීජවල, වගාකරන ලද ශාකවල සහ ගොවිපළ සහ ගෘහාශ්‍රිත සතුන්ගේ ජානමය විවිධත්වය පවත්වාගෙන යාම සහ හොඳින් කළමනාකරණය කරන ලද සහ විවිධත්වයන්ගෙන් යුත් බීජ සහ ශාක බැංකු ජාතික කලාපීය සහ අන්තර්ජාතික මට්ටමින් පවත්වාගෙන යාම සහ අන්තර්ජාතික වශයෙන් එකඟ වූ ආකාරයට ජාන සම්පත් සහ පාරම්පරික	රජයේ පැළ තවාන්වල බද්ධ රබර් පැළ නිෂ්පාදනය පැළ 1,300,000 ක් නිෂ්පාදනය කිරීම.	1,026,899	පැළ	79%

දැනුම උපයෝගි කරගැනීම මගින් ලබාගන්නා වූ ප්‍රතිලාභවලට ප්‍රවේශ වීම සහ සමානව භුක්ති විඳීම තහවුරු කිරීම.				
විශේෂයෙන් අවම වශයෙන් දියුණු වූ රටවල් ඇතුළුව දියුණු වෙමින් පවත්නා රටවල කෘෂිකාර්මික නිෂ්පාදන ධාරිතාව වැඩි කිරීම සඳහා, ඉහළ නංවන ලද අන්තර්ජාතික සහයෝගීතාවයෙන් ග්‍රාමීය යටිතල පහසුකම්, කෘෂිකාර්මික පර්යේෂණ සහ ව්‍යාප්ති සේවාවන්, තාක්ෂණ සංවර්ධනය සහ ශාක සහ පශු සම්පත් ජාන බැංකු සඳහා සිදු කරන ආයෝජන වැඩි කිරීම.	කිරි කැපුම් ශිල්පී සාමාන්‍ය පුහුණුව ලබාදීම - පුද්ගලයන් 2,920 බද්ධකරුවන් පුහුණු කිරීම පුද්ගලයන් 210	2,311 211	පුද්ගලයන් පුද්ගලයන්	79% 100%
2020 වන විට තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණයට ප්‍රවේශ වීමේ හැකියාව කැපී පෙනෙන ආකාරයට වර්ධනය කිරීම සහ අවම වශයෙන් සංවර්ධනය වී ඇති රටවලට අඩු මිලට සහ සැමටම අන්තර්ජාලය වෙත ප්‍රවේශ වීමේ අවස්ථාව සැලසීමට ප්‍රයත්න දැරීම.	රබර් තොරතුරු කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රාදේශීය කාර්යාල, රබර් සංවර්ධන නිලධාරීන් සහ තවාන් කළමනාකරුවන් සඳහා ටැබ් පරිගණක යන්ත්‍ර බෙදා දීම.	100	පුද්ගලයන්	100%
2030 වන විට ආබාධිත පුද්ගලයන් සහ යෞවනයින් ද ඇතුළත්ව සියලුම කාන්තාවන් සහ පිරිමින් සඳහා ඵලදායී හා සුනිසි රැකියා අවස්ථා ලබා දීම. කාලගුණ වෙනස් වීම අවම කිරීම, ඒ අනුව හැඩගැසීම, බලපෑම අවම කිරීම සහ පූර්ව අනතුරු සම්බන්ධයෙන් අධ්‍යාපනය, දැනුවත්භාවය ඉහළ නැංවීම සහ මානව සහ ආයතනික ධාරිතාවන් ඉහළ නැංවීම.	රබර් පිළිබඳ විශේෂිත පුහුණු ලබාදීම. 130 නිලධාරීන් හට කාර්ය සාධනය ඉහළ නැංවීමට පුහුණු වැඩ සටහන් පැවැත්වීම.	130 78	පුද්ගලයන් පුද්ගලයන්	100% 100%

වගු අංක LII

5.2. තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

2020 වර්ෂයේ දී රබර් නව වගාව සහ නැවත වගාව මගින් හෙක්ටයාර 1,173 ක් වගා කිරීමට රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව දායකත්වය ලබා දෙන ලදී. එසේම කුඩා තේ හා රබර් වතු පුනර්ජීවන ව්‍යාපෘතිය මගින් හෙක්ටයාර 529 ක් ද, වැවිලි සමාගම් මගින් නව වගාව හෙක්ටයාර 25 ක් ද වගා කරන ලදී. මෙමගින් වන ආවරණය හෙක්. 1,727 කින් වැඩි විය. ඒ තුළින් වායුගෝලීය ඔක්සිජන් ප්‍රතිශතය ඉහළ නැංවීමට දායක වීම තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම යටතේ ලද ජයග්‍රහණයකි. තව ද වර්ෂා කාලයේ දී රබර් කිරි කැපීමට නොහැකි වුව ද නව තාක්ෂණය භාවිතා කරමින් වැසි ආවරණ යොදා ගැනීමෙන් වැසි දිනවල දී අස්වැන්න නෙලා ගැනීමට හැකි වීම ද ලද ජයග්‍රහණයක් ලෙස සැලකිය හැකි ය.

6. පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1 . සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්ත)
ජ්‍යෙෂ්ඨ	37	23	14
තෘතියික	21	10	11
ද්විතියික	336	278	62
ප්‍රාථමික	84	66	18
කොන්ත්‍රාත්/ අනියම්	-	-	-

වගු අංක LIII

6.2. ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලබන ආකාරය

මෙම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති කටයුතුවල යෙදෙන අධිශ්‍රේණියේ රබර් සංවර්ධන නිලධාරි හා රබර් සංවර්ධන නිලධාරීන්ගේ පුරප්පාඩු පැවතීම ව්‍යාප්ති කටයුතුවල ඉලක්ක ලභාකර ගැනීම දුෂ්කර වීමට බලපාන සාධකයකි. එක් නිලධාරියෙකු පුරප්පාඩු කොට්ඨාශ දෙකක හෝ වැඩි ගණනක රාජකාරි ඉටු කිරීම සඳහා යෙදවීමට සිදුවීම නිසා මෙම තත්ත්වය ඇතිවී තිබේ. නව නිලධාරීන් බඳවා ගැනීමට අනුමැතිය ඉල්ලා ඇති අතර එම පුරප්පාඩු සම්පූර්ණ වීමෙන් මෙම තත්ත්වය විසඳා ගැනීමට හැකි වනු ඇත.

මෙම දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ පුහුණු අවශ්‍යතා වැඩි වුවත් ලබා දී ඇති ප්‍රතිපාදන එම සියලු පුහුණු අවශ්‍යතා සම්පූර්ණ කිරීමට ප්‍රමාණවත් නොවේ. එම නිසා නිලධාරීන්ගේ පුහුණු අවශ්‍යතා සම්පූර්ණ කරදීම ගැටලු සහගත වී තිබේ. එසේ වුව ද ලැබෙන ප්‍රතිපාදනවලින් උපරිම ඵලදායිතාවයක් ලැබෙන සේ කාර්ය මණ්ඩලයේ සියලු නිලධාරි කොට්ඨාශවලට සම අවස්ථා ලැබෙන සේ පුහුණු කටයුතු ඉටු කිරීමට කටයුතු කර ඇත.

6.3. මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (රුපියල්)		වැඩ සටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ ලබා ගත් දැනුම
			දේශීය	විදේශීය		
පශ්චාත් උපාධිය සඳහා පාඨමාලාව	03	වසර 01	388,500.00		දේශීය	වැඩි දැනුමක් ලබා ගැනීම තුළින් කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් ලබා ගැනීම
රබර් සංවර්ධන නිලධාරීන් සඳහා කිරි කැපුම් ශිල්පී පුහුණු වැඩසටහන (සිද්ධාන්ත හා ප්‍රායෝගික)	01	දින 21	120,600.00		දේශීය	කිරි කැපීම සම්බන්ධ සිද්ධාන්ත හා ප්‍රායෝගික පුහුණුව තුළින් දැනුම ලබා ගැනීම
බැහැරගත ක්‍රියාශීලී අභ්‍යාස සහිත ධාරිතා හා කුසලතා සංවර්ධන වැඩසටහන	40	දින 02	237,437.50		දේශීය	කාර්යාලය තුළ එකමුතුව වැඩ කිරීම, රාජකාරී ජීවිතය තුළ නිලධාරීන් ඇති කර ගත යුතු ආකල්ප හා කුසලතා වර්ධනය කර ගැනීම
ප්‍රසම්පාදන මාර්ගෝපදේශ පිළිබඳ පුහුණුව	01	දින 03	18000.00		දේශීය	ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධයෙන් දැනුම ලබා ගැනීම

වගු අංක LIV

6.4. රජයේ පැළ තවාන්වල සේවක සංඛ්‍යාව - 2020.12.31 දිනට

තවානේ නම	සේවක සංඛ්‍යාව
වැලිකඩමුල්ල තවාන	45
මීරිගම තවාන	31
ඇඟල්ඔය තවාන	41
ගුරුගොඩ තවාන	41
කරපිංව තවාන	31
කුඹුක්කන තවාන	82

පදියතලාව තවාන	**38**
මිද්දෙනිය තවාන	**21**
එකතුව	**330**

වගු අංක **LV**

❖ ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන්හි දායකත්වය

පුහුණුව මගින් පුද්ගලයෙකුගේ කාර්යසාධනය ඉහල නැංවීම හරහා දෙපාර්තමේන්තුවේ ඉලක්ක හා අරමුණු පහසුවෙන් ලගාකර ගැනීමේ හැකියාව පවතී. එමෙන්ම එදිනෙදා වෙනස් වන නීති රෙගුලාසි සහ අනෙකුත් කාර්යයන් පිළිබඳව දැනුම හා පුහුණුව ලබාදීම තුළින් සේවාවේ කාර්යක්ෂමතාවය වැඩිකර ගත හැකිය.

වැඩසටහනේ නම	වැඩසටහන් සංඛ්‍යාව	සහභාගී වූ සංඛ්‍යාව	වියදම (රු.)
විශ්‍රාම වැටුප් සම්බන්ධ වැඩමුළුව	01	02	10,000.00
විනය ක්‍රියාපටිපාටිය පිළිබඳ පුහුණු වැඩමුළුව	01	01	5,000.00
ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන	01	21	380,456.50
කම්කරු නීතිය පිළිබඳ පුහුණු වැඩසටහන	01	01	8,500.00
කිරි කැපුම් ශිල්පී පුහුණුව (සාමාන්‍ය) සාම්ප්‍රදායික නොවන ප්‍රදේශ	113	2311	3,570,000.00
බද්ධකරුවන් පුහුණුව	210	211	260,000.00
වෘත්තීය කිරි කැපුම් ශිල්පී පුහුණුව	07	212	1,340,000.00
රබර් ෂීට් නිෂ්පාදන පුහුණුව	510	1231	341,000.00
පාංශු සංරක්ෂණ ක්‍රම පුහුණුව			
ගෘහ ආශ්‍රිත රබර් භාණ්ඩ නිෂ්පාදන පුහුණුව			
කිරි කැපීම පිළිබඳ වැඩමුළුව **2020** - සියඹලාණ්ඩුව	01	30	44,926.00
අපරිනත හා පරිනත රබර් ගොවීන් දැනුවත් කිරීමේ වැඩමුළුව **2020** - වැල්ලවාය	01	40	44,562.00
රබර් ෂීට් නිෂ්පාදනය කිරීමේ එක්දින වැඩමුළුව **2020** - ලුණුගල	01	15	18,350.00
රබර් වගාව පිළිබඳ දැනුවත් කිරීමේ එක්දින වැඩමුළුව - අකුරුකඩුව	01	30	9,770.00
කිරි කැපුම් ශිල්පී පුහුණුව (සාමාන්‍ය)	10	199	398,900.00
කිරි කැපුම් ශිල්පී පුහුණුව (වෘත්තීය)	01	30	265,800.00
බද්ධකරුවන් පුහුණුව	01	30	47,500.00
ගෘහ ආශ්‍රිත කර්මාන්ත පුහුණුව	01	16	16,000.00
මී මැසි පාලනය ව්‍යාපෘතිය හා ආදර්ශ ගොවිපල	02	21	139,550.00

වගු අංක **LVI**

6.5. 2020 වර්ෂයේ ඉදි කිරීම් ප්‍රගතිය

ප්‍රාදේශීය කාර්යාලය	වැය විෂය	ව්‍යාපෘතියේ නම	ඇස්තමේන්තු ගත මුදල	භෞතික ප්‍රගතිය	වියදම (රු.)
කළුතර	2001	කළුතර ප්‍රාදේශීය කාර්යාලයේ වහළ අළුත්වැඩියා කිරීම	500,756.28	100%	463,774.98
	2001	ඉංගිරිය රබර් සං.නිලධාරී නිල නිවස අළුත්වැඩියා කිරීම (වහළ)	498,852.84	100%	481,372.07
	2001	ඇඟල්ඔය රබර් පැල තවානට පිවිසෙන බෝක්කුව ප්‍රතිසංස්කරණය	479,139.15	100%	383,311.32
	2001	කළුතර ප්‍රාදේශීය කාර්යාලයේ විදුලි පද්ධතිය අළුත්වැඩියා කිරීම	60,000.00	100%	45,394.00
	2001	හොරණ ර.සං.නි. කාර්යාලයට හා නිල නිවසට ජල සැපයුම් ලබා දීම	54,994.40	100%	54,994.90
	2507	විසිරුම් ජල සම්පාදන පද්ධතියක් ඉදිකිරීම - ඇඟල්ඔය තවාන	58,052.50	100%	28,935.40
	2507	ළපටි බද්ධ ග්‍රාහක වගා සඳහා ජල සම්පාදනය කිරීමට බිංදු ජල සම්පාදන පද්ධතියක් ඉදි කිරීම - ඇඟල්ඔය තවාන	60,326.20	100%	39,767.00
	2507	ජලසම්පාදන පද්ධතිය වැඩි දියුණු කිරීම - ගුරුගොඩ තවාන	283,250.00	100%	283,250.00
	2202	නව රබර් වගාව පිහිටුවීම සඳහා ක්ෂේත්‍රය සකස් කිරීම - ගුරුගොඩ තවාන	590,700.00	100%	537,000.00
	2202	නව රබර් වගාව පිහිටුවීම සඳහා ක්ෂේත්‍රය සකස් කිරීම - ඇඟල්ඔය තවාන	991,650.00	100%	910,800.00
මොනරාගල	2001	කාර්ය මණ්ඩලයේ නිලධාරීන් සඳහා වෙන් කර ඇති වැසිකිළි පද්ධතිය අලුත්වැඩියා කිරීම	388,221.00	100%	343,534.86
රත්නපුර	2001	මාණ්ඩලික නිලධාරී නිල නිවාස අංක 03 හි නාන කාමරය අලුත්වැඩියාව	299,000.00	100%	297,000.00
	2001	ඇලපාත ර.සං.නි. නිල නිවාසයේ අලුත්වැඩියාව	1,498,000.00	100%	1,428,000.00
	2001	රත්නපුර ප්‍රාදේශීය කාර්යාලයේ වැසිකිළි පද්ධතිය අලුත්වැඩියාව (අවිච්ඡේද)	133,000.00	100%	120,000.00
	2001	නිවිතිගල රබර් සංවර්ධන නිලධාරී කාර්යාලයේ අළුත්වැඩියාව (අවිච්ඡේද)	1,000,000.00	100%	865,000.00
	2001	නිවිතිගල රබර් සංවර්ධන නිලධාරී කාර්යාලයේ විදුලි	100,000.00	100%	89,000.00

		පද්ධතිය අළුත්වැඩියාව (අවිච්ඡේද)			
	2001	නිවිතිගල රබර් සංවර්ධන නිලධාරී කාර්යාලයේ වහලය අළුත්වැඩියාව (අවිච්ඡේද)	358,000.00	100%	369,000.00
	2202	කරපිංච රබර් පැල තවානේ ආදර්ශ ගොවිපල සඳහා බිම සැකසීම	299,000.00	100%	283,000.00
	2507	කරපිංච පැල තවානේ ගේට්ටුව හා මුරකුටිය ඉදිකිරීම	600,000.00	100%	600,000.00
	2507	කරපිංච පැල තවානේ අඩි **27x54** ප්‍රමාණයේ ආවරණ දැල් ගෘහ දෙකක් ඉදි කිරීම	329,000.00	100%	312,000.00
කෑගල්ල	**2001**	තෝලංගමුව ර.ස.නි.නිල නිවස වහලය අළුත්වැඩියා කිරීම	87,000.00	100%	87,000.00
	2001	තෝලංගමුව ර.ස.නි.නිල නිවාසයේ වහලය අළුත්වැඩියා කිරීම (ii කොටස)	56,500.00	100%	56,500.00
	2001	හතරලියද්ද ර.ස.නි. නිවාසයේ අළුත්වැඩියා කිරීම	282,382.68	100%	282,382.68
	2001	මාවනැල්ල ර.ස.නි. නිල නිවාසය අළුත්වැඩියා කිරීම	599,583.11	100%	599,583.11
	2001	කෑගල්ල කාර්යාලයේ ගබඩාවේ වහලය අළුත්වැඩියා කිරීම	362,000.00	100%	362,000.00
	2507	වැලිකඩමුල්ල තවානට නඟුල් තල හා උපාංග මිලදී ගැනීම	41,350.00	100%	41,350.00
	2507	වැලිකඩමුල්ල තවානට ජල නල උපාංග මිලදී ගැනීම	196,490.00	100%	196,490.00
	2507	මීරිගම තවානට ජල නල උපාංග මිලදී ගැනීම	566,923.00	100%	566,923.00
	2202	වැලිකඩමුල්ල තවානට ජල නල උපාංග මිලදී ගැනීම	33,355.00	100%	33,355.00
	2202	වැලිකඩමුල්ල තවානේ තෙකලා විදුලි මෝටරය අළුත්වැඩියා කිරීම	16,500.00	100%	16,500.00
	2202	වැලිකඩමුල්ල තවානේ අශ්ව බල **40** විදුලි මෝටරය අළුත්වැඩියා කිරීම	112,000.00	100%	112,000.00
ගාල්ල	**2001**	කඹුරුපිටිය ජ්‍යෙෂ්ඨ ර.ස.නි. කාර්යාලයේ අළුත්වැඩියාව	992,000.00	100%	925**,000**
	2507	මිද්දෙනිය තවානේ බද්ධ අතු තවාන ඉවත් කිරීම	405,000.00	100%	405**,000**
	2507	මිද්දෙනිය තවානේ දැල් ගෘහය ඉදි කිරීම	499,000.00	100%	499**,000**

7. පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම්	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	වෙනත්	අදාල නොවේ		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.5	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.6	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.9	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	උප පත්‍රිකා පොත් ලේඛනය (GAN 20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	ආයතනය තුළ මූල්‍ය බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		

3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ		
4.3	සමාලෝචිත වර්ෂය සඳහා 1971 අංක 38 දරණ මුදල් පනත ප්‍රකාරව අයවැය අනුමත කරගෙන තිබීම	අනුකූල වේ		
4.4	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ		
4.5	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.6	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
4.7	කාර්තු වාර්තා නියමිත දිනට මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දීම.	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA /1 – 2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම.	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		

7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම.	අනුකූල වේ.		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍ර ලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම.	අනුකූල නොවේ.		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම	අනුකූල වේ.		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම.	අනුකූල වේ.		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල නොවේ.		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම.	අනුකූල නොවේ.		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම.	අනුකූල වේ.		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව,	අනුකූල වේ.		

	වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම.			
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අනුකූල නොවේ.		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොයික්මවන පරිදි බැරකම්වලට එලඹීම	අනුකූල වේ		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂය නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	**පොදු තැම්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		

14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල නොවේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත් කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15.2	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම.	අනුකූල නොවේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලයිස්තු ලිඛිතව ලබා දී තිබීම.	අනුකූල වේ.		
16.3	**20.09.2017** දිනැති MSD චක්‍රලේඛ අංක **04/2017** ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කොට තිබීම.	අනුකූල වේ.		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල නොවේ.		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම.	අනුකූල වේ.		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ **08** වන හා **10** වන වගන්තිය ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කොට තිබීම.	අනුකූල වේ.		

18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම.**			
18.1	අංක **05/2018** හා **05/2018(1)** දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම.	අනුකූල වේ.		
18.2	එම චක්‍රලේඛයේ **2.3** ඡේදය පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම.	අනුකූල වේ.		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම.**			
19.1	**2018.01.24** දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක **02/2018** ඇමුණුම **02** ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම.	අනුකූල නොවේ.		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය **12** කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම.	අනුකූල වේ.		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම **01** හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම.	අනුකූල නොවේ.		
19.4	ඉහත චක්‍රලේඛයේ **6.5** ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම.	අනුකූල නොවේ.		
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම.**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		